# අපේ කුලපති නා හිමි



# අපේ කුලපති නා හිමි

# අපේ කුලපති නාහිමි

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙහි කුලපති ධූරය දරමින් වැඩ සිට අපවත් වී වදාළ අතිගරු මහාචාර්ය බෙල්ලන්විල විමලරතන අනුනාහිමිපාණන් වහන්සේගේ ශ්‍රී නාමයට විශ්වවිද්‍යාලයීය ප්‍රජාවේ ගෞරව සම්ප්‍රයුක්ත උපහාරය මෙසේ පුද කරමු.

ව්‍යවහාර වර්ෂ 1873 දී ත්‍රිපිටකවාගීශ්වරාචාර්ය අතිගරු හික්කඩුවේ ශ්‍රී සුමංගල මාහිමිපාණන් වහන්සේ විසින් කොළඹ මාළිගාකන්දේ දී සමාරබ්ධ විද්‍යෝදය පිරිවෙණ ප්‍රභවස්ථාන කොට වර්ෂ 1959 දී පණ්ඩිත ශිරෝමණී වැලිවිටියේ ශ්‍රී සෝරත නාහිමිපාණන් වහන්සේ විසින් ජාතියට දායාද කළ විද්‍යෝදය විශ්වවිද්‍යාලයෙන් ශාස්ත්‍රවේදී ගෞරව උපාධිය හිමි කර ගෙන එම විශ්වවිද්‍යාලයෙහි මහාචාර්යවරයාණ කෙනෙකු ලෙස ශාස්ත්‍රීය ලෝකයෙහි වැජඹුණු බෙල්ලන්විල නාහිමිපාණන් වහන්සේ සේවයෙන් විශ්‍රාම ගත් පසු 2005 වර්ෂයේ දී අප ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ම කුලපතීන් වහන්සේ බවට පත් ව අවශ්‍ය සෑම විටෙක දී ම අපට මාර්ගෝපදේශ සැපයූහ.

අප නො සිතූ මොහොතක අපවත් වී වදාළ අපේ කුලපති නාහිමිපාණන් වහන්සේ පිළිබඳ ව උන් වහන්සේගේ පූර්වකාලීනයන්ගේත් සමකාලීන හා පශ්චාත්කාලීනයන්ගේත් අදහස් මෙසේ සටහන් කරමු.

# අපේ කුලපති හාමුදුරුවෝ

''මහාචාර්ය බෙල්ලන්විල විමලරතන නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ අපවත් වූහ .''

මේ වූ කලි උදා වූ 2018 වර්ෂයේ දී අපට අසන්නට ලැබුණු අතිසංවේගජනක මෙන් ම අතිකම්පනීය පුවත යි. ගසට පොත්ත මෙන්, මලට සුවඳ මෙන් ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය සමග අත්‍යන්තයෙන් බැඳුණු අතිසහෘදය මහා යති පඬි රුවන මේ සටහන තබන අඳුරු නිමේෂයේ අප අතර දිවමන් ව නැත. ඒ උන් වහන්සේ 2018 පෙබරවාරි මස 03 වැනි සෙනසුරාදා සදහට ම දේශයට අහිමි ව ගිය බැවිනි. උන් වහන්සේගේ මේ අනපේක්ෂිත සමුගැන්මෙන් වික්ෂිප්ත සහ වේදනාවට පත් ව සිටින අප්‍රමාණ චරිත සමුදාය අතුරින් එක් චරිතයක් වන මම ශ්‍රී ජයවර්ධනපුර විද්‍යෝදය විශ්වවිද්‍යාලය නියෝජනය කරමින් උන් වහන්සේ පිළිබඳ ව මේ කෙටි සටහන තබනු කැමැත්තෙමි.

1942 අප්‍රේල් 14 වැනි දා බණ්ඩාරගම වීදාගම දී ඕමත්තගේ පෝල් පෙරේරා සහ පල්ලගේ දෝන බුත්සිලිනා ද සිල්වා යන දම්පතීනට දරු සුරතල් බැලීමේ අවස්ථාව සිව්වැනි වරටත් උදා විය. උපන් කුල කුමරුවා ඕමත්තගේ ගිල්බට් පෙරේරා නම් වූ අතර, නිකපෙ කනිෂ්ඨ විද්‍යාලයත් පිළියන්දල මධ්‍ය මහා විද්‍යාලයත් ඔහුට ශාස්ත්‍ර ශාලා විය. මෙසේ අධ්‍යාපනය හැදෑරූ ගිල්බට් පෙරේරා නමැති ශිෂ්‍ය මාණවකයා 1956 පෙබරවාරි මාසයේ දිනයක ගිහිගේ අත් හැර දමා පැවිදි බිමට ඇතුළත් විය. මේ පසු කලෙක ශ්‍රී ලාංකේය සංඝ සමාජයේ අතිප්‍රබල සංඝ පිතෘන් වහන්සේ නමක බවට පත් වන අතිපූජ්‍ය බෙල්ලන්විල විමලරතන නාහිමියන්ගේ ශ්‍රමණ ජීවිතයේ සමාරම්භය යි.

මෙරට කීර්තිමත් යති පඬි රුවන් රැසක අධ්‍යාපන චාරිකාවේ මුල් බිම් වූ මොල්ලිගොඩ ප්‍රවචනෝදය මහ පිරිවෙනින් සහ පැලියගොඩ විද්‍යාලංකාර මහපිරිවෙනින් අධ්‍යාපනය ලැබීමට

භාග්‍යවත් වූ බෙල්ලන්විල විමලරතන හිමියෝ අනතුරු ව 1965 දී ශාස්ත්‍රවේදී උපාධිය දිනා ගත්හ. අනතුරු ව 1972 වර්ෂයේ දී පාලි භාෂාව සහ සාහිත්‍යය පිළිබඳ ව එවකට විද්‍යෝදය විශ්වවිද්‍යාලය නමින් ප්‍රචලිත ව තිබූ වර්තමාන ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් විශේෂවේදී උපාධිය දිනා ගැන්මට සමත් වූහ. ඒ වන විට තිස් හැවිරිදි වියේ සිටි මේ වියත් පඬි රුවන එම සරසවියේ සුවිසල් තනතුර වන කුලපති ධුරයට තමා මතු අනාගතයේ දී භාග්‍යවත් වනු ඇතැයි නොසිතන්නට ඇත.

සිය ප්‍රථම උපාධියෙන් සෑහීමට පත් නොවූ මේ උතුම් යති පඬි රුවන එංගලන්තයේ ලැන්කැස්ටර් විශ්වවිද්‍යාලය නමැති ජාත්‍යන්තර කීර්තියට පත් ශාස්ත්‍රාලයට ඇතුළත් ව 1980 වර්ෂයේ දී සිය ආචාර්ය උපාධිය දිනා ගත්හ. පසු කලක උන් වහන්සේ බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයෙන් මෙන් ම සබරගමුව විශ්වවිද්‍යාලයෙන් ද සාහිත්‍යසූරී උපාධියෙන් සම්මානිත වූහ.

විමලරතන නාහිමියන් සිය ගුරු ජීවිතය ආරම්භ කරන්නේ පැපිළියානේ සුනේත්‍රා දේවී පිරිවෙනිනි. රත්මලාන පරම ධම්මචේතිය පිරුවනෙහි පරිවේණාධිපතිවරයා බවට ද පත් වූ උන් වහන්සේ පසු ව රත්මලානේ පිරිවෙන් ගුරු අභ්‍යාස විද්‍යාලයේ කථිකාචාර්යවරයකු වශයෙන් සේවයට පත් වන්නේ 1976 වර්ෂයේ දී ය. 1980 වර්ෂයේ දී ආරාධිත කථිකාචාර්යවරයකු ලෙස ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයට සම්බන්ධ වන මේ මහා යති පඬි රුවන කථිකාචාර්ය, සහාය මහාචාර්ය තනතුරු පසු කරමින් විත් මහාචාර්ය තනතුරට පත් වන්නේ 2003 වර්ෂයේ දී ය. සිය සේවා ප්‍රදානය ලක් සරසවිවලට පමණක් සීමා නො කළ මහාචාර්ය විමලරතන හිමියෝ එංගලන්තයේ ලන්ඩන් සරසවියේ ද ආරාධිත මහාචාර්යවරයකු වශයෙන් කලක් සේවය කළහ. ඒ උදාර චරිතයක් ඇති විද්වතකුට ලොව ඕනෑ ම තැනකට සිය සේවය ලබා දිය හැකි ය යන අදහස සනාථ කරවමිනි.

විමලරතන නාහිමියන් සිය සේවා ජීවිතයට අයත් දෙවසරක් පමණ ඉතුරු ව තිබිය දී විශ්‍රාම ලබන්නේ සරසවි පද්ධතියෙන් එපිටට ද පුළුල් ව පැතිරෙන පරිදි ආගමික-සමාජීය-ශාස්ත්‍රීය කටයුතු කිරීමේ පරමාභිලාෂයෙනි. එහෙත් උන් වහන්සේ ශ්‍රී ජයවර්ධනපුර

විශ්වවිද්‍යාලයෙහි කුලපති ධුරයෙන් පිදුම් ලබන්නේ බෙල්ලන්විල විමලරතන අනුනා හිමි යනු අප සරසවියට නැති ව ම බැරි මහරු චරිතයක් ය යන්න යළිදු සනාථ කරවමිනි.

එතැන් සිට නොයෙක් ආගමික-ශාස්ත්‍රීය සේවාවන් මධ්‍යයෙහි ම විශ්වවිද්‍යාලයේ කුලපති ධුරයෙහි වගකීම් ද නොපිරිහෙළා ඉටු කිරීමෙහි තත්පර වූ උන් වහන්සේ ස්වකීය සෞඛ්‍ය තත්ත්වය කෙබඳු වුවත් තමන් වහන්සේගේ සහභාගිත්වය අත්‍යවශ්‍ය ම වූ උපාධි ප්‍රදානෝත්සවය ඇතුළු සරසවියේ කටයුතුවලට සිය උපරිම දායකත්වය ලබා දුන්හ. එලෙස අපේ නායක හාමුදුරුවන් අතින් ප්‍රථම උපාධිය හෝ පශ්චාද් උපාධි හෝ ලද විශ්වවිද්‍යාලයීය ශිෂ්‍ය සංඛ්‍යාව අප්‍රමාණ ය. මා දන්නා තරමින් ශ්‍රී ලාංකේය සරසවි පද්ධතියේ වැඩි ම සේවා කාලයක් සම්පූර්ණ කළ කුලපතිවරයා වූයේ ද බෙල්ලන්විල විමලරතන නාහිමි ය. උන් වහන්සේගේ කුලපතිත්වය ඇති ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරුන් ලෙස සේවය කිරීමට ජ්‍යෙෂ්ඨ ආචාර්යවරු පස් දෙනෙක් භාග්‍යවත් වූහ. උන් වහන්සේගේ මේ නො සිතූ විරූ සමුගැන්ම සිදු වන මේ සංවේග ජනක අවස්ථාවේ එකී පස් වන උපකුලපතිවරයා ලෙස මෙවන් කම්පනීය සටහනක් තැබීමට සිදු වෙතැයි මම කිසි කලෙකත් නො සිතුවෙමි.

1983 වර්ෂයේ දී මෙම සරසවියට ශිෂ්‍යයකු ලෙස ඇතුළත් වූ මට පාලි හා බෞද්ධ අධ්‍යයනාංශයේ ජ්‍යෙෂ්ඨ ආචාර්යවරයකු වශයෙන් සේවය කළ උන් වහන්සේ දැක ගැන්මට ලැබිණ. ඥානයෙන් මිස මානයෙන් නො පිරුණු හිසින් ද සාමයෙන් මිස පාපයෙන් නො පිරුණු හදින් ද යුතු උන් වහන්සේ එදා සරසවි බිමේ දී මට නොයෙක් වර මුණ ගැසුණු සැටිත් මා හා කතා-බහ කළ සැටිත් අද සොවින් බර හදින් යුතු ව සිහිපත් කරන්නේ ද උන් වහන්සේට කෙරෙන ගෞරවයක් ලෙසිනි.

එසේ ම උන් වහන්සේ සේවය කරන කාලයේ දී ම ආචාර්යවරයකු වශයෙන් සරසවි ආචාර්ය මණ්ඩලයට එක් වීමට මට අවස්ථාව ලැබිණ. අනතුරු ව උපකුලපතිවරයා ලෙස උන් වහන්සේ කුලපති ධුරය ඉසිලූ ඓතිහාසික යුගයේ ඒකදේශයක් නියෝජනය කිරීමටත් මට අවකාශ ලැබිණ. හිමි වීම් මෙන් ම

අභිමි වීම් ද ජීවිතය හා බැඳුණු ධර්මතා ය යන බුදු වදන සනාථ කරවමින් උන් වහන්සේගේ සමුගැන්ම නමැති මහා අභිමි වීමට හිමිකම් කීමට ද අපට සිදු විය. එය මට පමණක් නො ව අප මුළු මහත් සරසවියට ම අභිමි වීමකි; සරසවි පද්ධතියට ම සුවිශිෂ්ට ශාස්ත්‍රවන්තයකුගේ අභිමි වීමකි; මහා ප්‍රඥාංකුරයකු වූ යති පඬි රුවනක අභිමි වීමකි; තමා නිවැරදි යැයි විශ්වාස කළ දෙය වෙනුවෙන් කොන්දේසි විරහිත ව පෙනී සිටි අභීත හඬ පෞරුෂයක අභිමි වීමකි.

විමලරතන හිමියන් සතු දැනුම ද හැකියාව ද තැනකට දෙකකට පමණක් සීමා නො වී ය. සිංහල, පාලි, සංස්කෘත, ඉංග්‍රීසි ආදි පෙරපර දෙදිග ම භාෂා ඥානය උන් වහන්සේට තිබිණ. බෞද්ධ මූර්ති කලාව පිළිබඳ ව මෑතකාලීන ලංකාවේ සිටින ඉහළ ම තලයේ ප්‍රාමාණිකයන් අතුරින් කෙනකු වීමට තරම් උන් වහන්සේ සතු දැනුම සුවිශේෂ විය. එසේ ම උන් වහන්සේ විසින් සිංහල භාෂාවෙන් සහ ඉංග්‍රීසි භාෂාවෙන් සම්පාදනය කරන ලද විවිධ පර්යේෂණ ග්‍රන්ථ මෙන් ම ශාස්ත්‍රීය ලේඛන ද සාක්ෂි දරන්නේ උන් වහන්සේගේ ශාස්ත්‍රවන්ත භාවයට යි.

උන් වහන්සේ කෝට්ටේ ශ්‍රී කල්‍යාණි සාමග්‍රී ධර්ම මහා සංඝ සභාවේ අනුනායක පදවිය දරමින් ජාතික වශයෙන් ද ලෝක බෞද්ධ සංඝ සම්මේලනයේ ලේඛකාධිකාරී ධුරයක් දරමින් අන්තර්ජාතික වශයෙන් ද ඉමහත් සේවයක් ඉටු කළහ. ඒ ආගමික වශයෙනි. මීට අමතර ව උන් වහන්සේ විසින් සේවය සපයන ලද සමිති-සමාගම් ද දරන ලද විවිධ තනතුරු ද රාශියකි. ඒ සාමාජික වශයෙනි. මෙසේ නොයෙක් අංශවලට සුවිශිෂ්ට සේවා ප්‍රදානයක් කළ උන් වහන්සේ සිය වැදූ මවට, උපන් බිමට ණය නැති නිදහස් නිවහල් චරිතයක් බවට පත් වූහ.

බෙල්ලන්විල අනුනා හිමියන් සතු වටිනා චරිත ලක්ෂණ රාශියකි. ඒ සියලු චරිත ලක්ෂණ පිළිබඳ ව සටහන් කිරීමට මෙවන් කෙටි ලේඛනයක් කිසි සේත් ප්‍රමාණවත් නො වේ. එහෙයිනි, උන් වහන්සේගේ අපට වඩාත් දැනුණු ගුණ කිහිපයක් ගැන පමණක් සඳහන් කරන්නේ. උන් වහන්සේ උජුපටිපන්න එනම් ඍජු ප්‍රතිපන්න ගුණය පිළිබඳ ව මේ යුගයේ ජීවමාන නිදර්ශනයක් වූහ;

කලිනුදු කී පරිදි ජාතික-ආගමික කටයුතුවල දී නිවැරදි සේ තමන් දුටු මතය නොසඟවා ඉදිරිපත් කළහ; ඒ වෙනුවෙන් දිරි ගෙන ක්‍රියා කළහ; කිසිදු දේශපාලන පක්ෂයක කොටසක් නො වී සමස්ත දේශයේ ම අභිවෘද්ධිය උදෙසා පෙනී සිටියහ.

නියම බෞද්ධ භික්ෂුව කෙබඳු විය යුතු දැයි මැනැවින් අවබෝධ කොට සිටි විමලරතන හිමියෝ සහජීවනය පිරුණු සමාජයක් අපේක්ෂා කළහ. ගෞරව සම්පන්න සාමය උදෙසා නිබඳ පෙනී සිටි උන් වහන්සේ ශ්‍රී ලාංකිකයන් අතර අන්‍යෝන්‍ය සුහදතාව වැඩිදියුණු කිරීමට, ජාතික සමගිය ඇති කිරීමට දැරූ ප්‍රයත්නය කොතරම් ද යන්නට 'බුදු දහම හා සමාජ සේවය', 'ශ්‍රී ලංකාවේ බුදුදහම හා ජනවාර්ගික අර්බුදය', 'බහුතරයේ හා සුළුතරවල අනන්‍යතාව', 'ආගමික විවිධත්වය වටහා ගැනීම සහ ජාතික සමගියේ වටිනාකම' ආදි මාතෘකා යටතේ ඉදිරිපත් කරන ලද පර්යේෂණ පත්‍රිකා සාක්ෂි දරයි. එම අදහස් පර්යේෂණ පත්‍රිකාවලට පමණක් සීමා නො කොට ප්‍රායෝගික තලයට ද ගෙනා අපේ කුලපති හාමුදුරුවෝ විවිධ ජාතීන් සමඟ, විවිධ ආගමිකයන් සමග නො ගැටී, මනා අවබෝධයෙන් සහ අන්‍යෝන්‍ය සුහදතාවෙන් යුතු ව ජීවත් වූහ.

බුදු සමය නමැති මහා වෘක්ෂය කපා දැමුව හොත් බෞද්ධයන්ට පමණක් නො ව අබෞද්ධ ජනතාවටත් එහි සෙවණ අහිමි වන බව විමලරතන හිමියෝ මනා ව දැන සිටියහ. එසේ ම බුදු සමය සුරැකීම යනු සියලු ධාර්මික සංස්ථාවන්ගේ පැවැත්ම තහවුරු කිරීම ය යන අවබෝධය ද උන් වහන්සේ සතු විය. අප නාහිමියන් සමීප ව ඇසුරු කළ විවිධ ජාතීන්ට අයත් චරිත ද විවිධ ආගම්වලට අයත් චරිත ද උන් වහන්සේගේ බෞද්ධකම හා බැඳුණු මේ පෘථුල අර්ථය මැනවින් වටහා ගෙන සිටියහ. ජාති-ආගම්-පක්ෂ භේදයකින් තොර ව අප්‍රමාණ ජනතාවක් උන් වහන්සේ අපවත් වූ අවස්ථාවේ සිට මේ දක්වා සිය අවසන් ගරු බුහුමන් කිරීම සඳහා බෙල්ලන්විල රාජමහා විහාරය වෙත ගඟක් සේ ගලා ආවේ එහෙයිනි. ඒ වූ කලි උන් වහන්සේගේ අප්‍රමාණ ගුණ සමුදාය වෙත පළ කෙරුණු පූජාවකි. මේ අවස්ථාව අපට සිහිපත් කර දුන්නේ රත්න ශ්‍රී විජේසිංහ නමැති ප්‍රවීණ කලාකරුවාගේ

සංකල්පයකි. එහි එක් තැනක් පමණක් වෙනස් කොට අපගේ අතිපූජනීය නාහිමියන් පාමුල මලක් කොට පුදනු රිසියෙමි

''එක මලෙක නම් නොවේ මැ යි
මල් යායක සිරස නැමේ
පිතු සෙනේහයෙන් ලොව කියා දුන්නු
යති පාද පියුම් සුවඳ යි"

භික්ෂුවකගේ උරුමය මනා සේ හඳුනා ගත් බෙල්ලන්විල අනුනා හිමියෝ සිය පා සෙවණෙහි රැඳුණු සාමණේරයන් වහන්සේට ආදරබර පිය කෙනෙක් වූහ; ආධ්‍යාපනික කෘති මඟින් දුටු-නුදුටු දහස් ගණන් සිසු පිරිසට ගුරු කෙනෙක් වූහ; ත්‍රිපිටක ග්‍රන්ථ පරිවර්තනයෙහි සමත්කම් පෑ අග්‍රගණ්‍ය පාලි පඬි රුවනක් වූහ; සසුන් බර දරා සතන් යහ මඟ යැවූ නායකයෙක් වූහ; ආශ්‍රිතයන්ගේ දියුණුවට මඟ පෑ කල්‍යාණ මිත්‍රවරයෙක් වූහ; දායක-කාරකාදින්ගේ දෙලෝ වැඩ සලසන සුලු දහම් ඔවා සැපයූ සංඝ පිතෘන් වහන්සේ කෙනෙක් වූහ; අසන්නන්ගේ කන්හි මිහිරි අමා වන් වදන් ලෑ චතුර දේශකයෙක් වූහ; ජාතික-අන්තර්ජාතික මට්ටමින් බුද්ධ ධර්මය ව්‍යාප්ත කළ ධර්ම ප්‍රචාරකයෙක් වූහ; පුවත්පත් ලිපි, සඟරා ලිපි මඟින් සමාජය සදාචාරවත් කළ සුවිශිෂ්ට ලේඛකයෙක් වූහ; කෙතට දියවර සපයන පිණිස පිරුණු වැවක් සේ අනුනට සෙත සපයන පිණිස ම දැනුමින් පිරිපුන් වූ ශාස්ත්‍රවන්ත බහුශ්‍රැතයෙක් වූහ; 'කිං සච්චගවේසී' යන පාලි පාඨයේ අර්ථය වන සත්‍යය කුමක් දැයි සොයන පර්යේෂකයෙක් වූහ; ඒ සියල්ලට ම වඩා වචනයේ පරිසමාප්ත අර්ථයෙන් ම සුපේශල ශික්ෂාකාමී බුද්ධ පුත්‍රයෙක් වූහ.

දේශයට මතු නොව ලොවකට අහිමි ව ගියේ ඒ උත්තම චරිතය යි. ඇතැම් හිස්තැන් පිරෙයි. ඇතැම් හිස්තැන් කිසි දා නොපිරෙයි. බෙල්ලන්විල විමලරතන අනුනාහිමියන්ගේ සමුගැන්ම නිසා ඇති වූයේ ද කිසි දා නොපිරෙන හිස්තැනකි

ගුණ සුවඳ මල්-පල පිරි ඒ සුවිසල් රුක අද අපට අහිමි ය. ඒ අම සිහිල් සෙවණේ සැනසෙන්නට මින් මතු සරසවි සිසුවන්ට

වරම් නැත. එහෙත් උන් වහන්සේ විසින් ඉටු කරන ලද මහත් මෙහෙයෙහි සාධනීය ප්‍රතිඵල අනාගත පරම්පරාවට ද භුක්ති විඳිය හැකි ය. ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය යම් තාක් පවතී ද, ඒ තාක් අතිපූජ්‍ය බෙල්ලන්විල විමලරතන නාහිමි නාමය ද නොමැකී පවතිනු ඇත. බෙල්ලන්විල රාජමහා විහාරයේ දී වේවා, අත්තිඩිය මාළිගාවත්ත පුරාණ විහාරයේ දී වේවා, වෙනත් විහාරස්ථානයක දී වේ වා, උන් වහන්සේගේ භෞතික රූපකාය අපට දැක ගැන්මට ලැබෙන්නේ නැත. එහෙත් උන් වහන්සේගේ ගුණකාය පිළිබඳ ආදරණීය මතකය කිසි දා නොමියෙනු ඇත

අපවත් වී වදාළ අතිපූජ්‍ය මහාචාර්ය බෙල්ලන්විල විමලරතන අනුනායක ස්වාමීන්ද්‍රයන් වහන්සේට අමා මහා නිවන් සුවය ම අත් වේවා!

**මහාචාර්ය සම්පත් අමරතුංග**

**උපකුලපති - ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය**

# ශ්‍රී ජයවර්ධනපුර සරසවියේ පාලි හා බෞද්ධ අධ්‍යයනාංශයෙන් බිහි වූ අපේ කුලපති නාහිමි

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ පාලි හා බෞද්ධ අධ්‍යයනාංශයේ කථිකාචාර්යවරයකු වශයෙන් 1980 වර්ෂයේ දී විශ්වවිද්‍යාල සේවයට එක් වූ බෙල්ලන්විල විමලරතන ස්වාමීන්ද්‍රයන් වහන්සේ පිළිවෙළින් මහාචාර්ය තනතුර දක්වා උසස්වීම් ලබා 2005 වර්ෂයෙහි සේවයෙන් විශ්‍රාම ලැබ එම වර්ෂයේ දී ම අප විශ්වවිද්‍යාලයේ කුලපති ධුරයෙන් පිදුම් ලැබූහ.

පාලි භාෂා සාහිත්‍යය පිළිබඳ ඉගැන්වීම් කාර්යයෙහි නියැලි උන්වහන්සේ පාලි හා බෞද්ධ අධ්‍යයනාංශයේ උන්නතිය වෙනුවෙන් අංශප්‍රධානත්වය ආදි පරිපාලන තනතුරු ද දරමින් කැපවීමෙන් ක්‍රියා කළහ. සේවයෙන් විශ්‍රාම ලැබීමෙන් පසු ව වුව ද අප අධ්‍යයන අංශයේ උන්නතිය වෙනුවෙන් උන්වහන්සේගෙන් ලැබුණු මාර්ගෝපදේශය ප්‍රශංසනීය වේ.

තමන් වහන්සේ ශාසනික වශයෙන් අයත් වූ කෝට්ටේ ශ්‍රී කල්‍යාණී සාමග්‍රීධර්ම මහාසංඝ සභාවේ භාරදූර වගකීම් සහිත තනතුරු ද බෙල්ලන්විල රාජමහා විහාරයේ සහ අත්තිඩිය මාළිගාවත්ත පුරාණ විහාරයේ විහාරාධිකාරී තනතුරු ද ජාතික හා අන්තර්ජාතික තනතුරු රැසක් ද දරමින් ශ්‍රී ලාංකේය භික්ෂු සංඝයාගේ නිකාය සහ නිකායාන්තර කටයුතුවල ද නිරත වෙමින් වැඩ සිටි බෙල්ලන්විල විමලරතන ස්වාමීන්ද්‍රයන් වහන්සේ සිය ශාස්ත්‍රීය ජීවිතය කිසි දා අමතක නො කළහ. එය අප රටේ සමස්ත භික්ෂුසංඝයා විසින් ම ආදර්ශයට ගත යුත්තක් බව අපි තරයේ විශ්වාස කරමු.

තමන් වහන්සේගේ කාලය කිසිදා අපතේ නො යැවූ බෙල්ලන්විල නාහිමිපාණන් වහන්සේ ශාස්ත්‍රීය සේවය වෙනුවෙන්

දක්වූ ඇල්ම පුදුම සහගත ය. උන් වහන්සේ ස්වකීය ආවාසයේ වූ කාර්යාල කාමරයෙහි මේසය මත පොත්පත් වටකොට ගෙන ග්‍රන්ථකරණයේ නියැලි අයුරු අප නිතර දක ඇත. අප කුලපති නාහිමිපාණන් වහන්සේ අපවත් වන තුරු ම ශාස්ත්‍රීය සේවයේ නියැලී සිටි බව අපි දනිමු. 'බෞද්ධ මූලධර්මවාදය, ප්‍රොතෙස්තන්ත වාදය හා අනගාරික ධර්මපාල' නමින් කෘතියක් පළ කිරීමට පසුගිය මාස ගණනාවෙහි උන්වහන්සේ අපමණ වෙහෙසී ක්‍රියා කළහ. තමන් වහන්සේ සමීප ව ආශ්‍රය කළ විද්වතුන් නිතර සම්බන්ධ කර ගත් උන් වහන්සේ ඒ සඳහා අවශ්‍ය කරන ලිපි ලේඛන සොයා ගැනීමට උත්සුක ව ක්‍රියා කළහ. අපහට ද ඇතැම් අවස්ථාවල දී ඒ සඳහා දායකත්වය ලබා දීමට හැකි වූ බව ගෞරවයෙන් සිහිපත් කරමු. එහෙත් යුගයේ අවශ්‍යතාවක් වූ එම ශාස්ත්‍රීය මෙහෙවර නිමා කරලන්නට අප කුලපති නාහිමිපාණන් වහන්සේට අවස්ථාව නො ලැබිණි.

පර්යේෂකයකු ලෙස බෙල්ලන්විල නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ වඩාත් රුචි කළ විෂය ක්ෂේත්‍ර කිහිපයකි. බුද්ධ හා බෝධිසත්ත්ව සංකල්ප, බුද්ධප්‍රතිමා කලාව හා බිතු සිතුවම්, මහායාන බුදුදහම, බුද්ධාගම හා වෙනත් ආගම් ඒ අතර කැපී පෙනෙයි. සිංහල හා ඉංග්‍රීසි භාෂා දෙකෙහි ම හසළ වූ උන්වහන්සේ විසින් පළ කෙරුණු ග්‍රන්ථ රැසකි. ශාස්ත්‍රීය සංග්‍රහ වෙනුවෙන් ලියන ලද පර්යේෂණාත්මක ලිපි සියගණනකි. පුවත්පත්වලට සැපයූ ලිපි දහස් ගණනකි. උන්වහන්සේ විසින් රචිත ග්‍රන්ථවලින් තෝරාගත් කිහිපයක් පහතින් දක්වේ.

**සිංහල බසින් පළ කළ ග්‍රන්ථ**

**බෞද්ධ සම්ප්‍රදාය හා සංස්කෘතිය** (1984)

**බුදුදහම සහ වෙනත් ආගම්** (1989)

**බුදුපිළිමය, මුද්‍රා සහ ආසන** (1991)

**බුද්ධප්‍රතිමා කලාව හා බුදුපිළිමයේ විකාශය** (1995)

**ලබුගම ලංකානන්ද මාහිමි ධර්මශාස්ත්‍රීය සේවය** (1996)

**බෞද්ධ මහාපුරුෂ සංකල්පය** (2000)

**ප්‍රඥා පාරමිතා සාහිත්‍යය** (2000)

**විචාර ලිපි සරණිය** (2006)

**බණ දහයක්** (2006)

**බුදුදහම, සාහිත්‍යය හා කලාව** (2006)

**බුදුපිළිමයට පෙර බුදු හාමුදුරුවෝ** (2010)

**බෞද්ධ පුදපූජා සංස්කෘතිය** (2013)

**බුදුවරු සහ බෝසත්වරු** (2015)

**බුදුදහම හඳුනා ගැනීම** (2016)

**බෞද්ධ මූලධර්මවාදය, ප්‍රොතෙස්තන්ත වාදය හා අනගාරික ධර්මපාල** (2018 අමුද්‍රිත)

**පරිවර්තන ග්‍රන්ථ**

**අංගුත්තර නිකාය - ප්‍රථම භාගය** (1990)

**නොසැලෙන මනස** (1992)

**මිනිසාගේ ආගම්** (1999)

**ඉංග්‍රීසි බසින් පළ කළ ග්‍රන්ථ**

*Buddhism Society and Environment* (1989)

*The Concept of Great-Man in Buddhist Literature and Iconography* (1996)

*Buddhism among the other Religions* (2000)

*Essays on facts of Buddhism* (2006)

මෙම ග්‍රන්ථාවලිය විමර්ශනශීලී ව අධ්‍යයනය කිරීමෙන් බෙල්ලන්විල නාහිමිපාණන් වහන්සේගේ නොනිමි ශාස්ත්‍රීය මෙහෙවර උන්වහන්සේ විශ්වවිද්‍යාලයීය විද්වතකු වූ තැන් පටන් අපවත් වීම දක්වා ක්‍රමානුකූලව විකාශය වී ඇති ආකාරය අවබෝධ කර ගත හැකිය. සිය ගණනක් වූ පර්යේෂණාත්මක ශාස්ත්‍රීය

ලේඛන නම් වශයෙන් ගෙන පෑමට මෙහි ලා අවකාශයක් නැත. මෙවන් ශාස්ත්‍රීය කාර්ය සාඵල්‍යයකින් රටෙහි සම්භාවිත ශාස්ත්‍රඥයන් වහන්සේ නමක බවට පත් වූ මහාචාර්ය බෙල්ලන්විල විමලරතනාභිධාන අපේ කුලපති ස්වාමීන්ද්‍රයන් වහන්සේට නිවන් සුව පතමි.

**රාජකීය පණ්ඩිත, මහාචාර්ය මැදගම්පිටියේ විජිතධම්ම ස්ථවිර**

අංශාධිපති - පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය

# මා දුටු මහාචාර්ය බෙල්ලන්විල විමලරතන නාහිමි

අපේ බෙල්ලන්විල නාහිමිපාණන් වහන්සේ ශ්‍රී ලාංකේය බෞද්ධ සමාජය අර්ථයෙන් හා ධර්මයෙන් පෝෂණය කිරීම සඳහාත් ශාස්ත්‍ර ඥානයෙන් පිරිපුන්, ගුණ-නැණින් හෙබි අනාගත පරපුරක් බිහි කිරීම සඳහාත් රට, දැය, සමය, භාෂා සාහිත්‍යය හා සංස්කෘතිය සුරක්ෂිත කිරීම සඳහාත් අප්‍රතිහත ධෛර්යයෙන් හා කැපවීමෙන් අමිල මෙහෙවරක් ඉටු කළ අද්‍යතන යුගයේ පහළ වූ අභීත සංඝපිතෘන් වහන්සේ නමකි.

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ වසර 20කට ආසන්න කාලයක් උන් වහන්සේ ඇසුරු කරන්නට මාහට භාග්‍යය උදා විය. ඉන් වසර හතරක් ශිෂ්‍යයකු ලෙසිනි. වසර 15ක් ආචාර්යවරයකු ලෙසිනි. දසක කිහිපයක් විශ්වවිද්‍යාල ආචාර්යවරයෙක් වශයෙන් හා කුලපති වශයෙන් ද කටයුතු කළ උන් වහන්සේ ස්වකීය කාර්යභාරය අකුරට ම ඉටු කිරීමට වගබලා ගත්හ. ඉගැන්වීමේ ක්‍රියාවලියට අමතර ව විශ්වවිද්‍යාලයේ පරිපාලන කටයුතුවලට ද ශිෂ්‍ය සුභසාධක කටයුතුවලට ද ස්වකීය දායකත්වය ලබා දුන්හ. මා උන් වහන්සේගෙන් දුටු විශේෂ ලක්ෂණය වන්නේ විශ්වවිද්‍යාලය තුළ යම් යම් අර්බුද ඇති වූ අවස්ථාවල දී ඒවා නිරාකරණය කර ගනු වස් නිර්භය ව තීන්දු තීරණ ගනිමින් පරිපාලන කටයුතවලට වෙසෙස් දායකත්වයන් ලබා දීම යි. තව ද විශ්වවිද්‍යාලයීය ආචාර්ය මණ්ඩලය සමග සුහදශීලී ව කටයුතු කළ උන් වහන්සේ ආචාර්යවරුන්ගේ සැප දුක් දෙකේ දී ම අනුග්‍රහ කරමින් ස්වකීය ලෙන්ගතුකම ප්‍රකට කළහ. විශ්වවිද්‍යාලයේ පීඨ මණ්ඩලය, සනාතන සභාව ද නියෝජනය කළ උන් වහන්සේ ඒ සෑම කාර්යයක දී ම වගකීම් සහගත ව ස්වකීය දායකත්වය ලබා දුන්හ. විශ්වවිද්‍යාලයීය ශිෂ්‍ය ප්‍රජාව කෙරෙහි ද නිරන්තර අවධානයෙන් හා සානුකම්පිත ව කටයුතු කළ උන් වහන්සේ සෑම විට ම ශිෂ්‍ය භික්ෂූන් වහන්සේ වෙනුවෙන් පෙනී සිටියහ. ඒ අතර දසක කිහිපයක් තිස්සේ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ කොටගම ශ්‍රී

වාචිස්සර සංඝාරාමයේ වැඩසිටින ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලාගේ දානය සකස් කර ගැනීමට අවශ්‍ය ගෑස් ලබා දීම උන්වහන්සේ විසින් පිහිටුවන ලද අරමුදලකින් සිදු කරනු ලැබීම උදාහරණ ලෙස දැක්විය හැකි ය. බෙල්ලන්විල ශ්‍රී සෝමරතන ස්වර්ණ මුද්‍රිකාව වැනි ශිෂ්‍යත්ව පිහිටුවා දක්ෂ විද්‍යාර්ථීන් ඇගයීම ද උන් වහන්සේගේ තවත් කාර්යයක් විය.

විශ්වවිද්‍යාලයීය ආචාර්යවරයකු වශයෙන් මෙන් ම සංඝ පිතෘන්වහන්සේ නමක් වශයෙන් ද කිසි දා තනතුරු පසුපස හඹා නො ගිය උන් වහන්සේ ඇතැම් අවස්ථාවල තමා වෙත පැමිණි තනතුරු, ගරු සම්මාන හා ඇගයීම් ආදිය පවා ප්‍රතික්ෂේප කිරීමට තරම් අනතිමානී වූහ. තමාට ලැබුණු ගරු සම්මාන ආදියෙන් උන් වහන්සේ වැජඹීම වෙනුවට අදාළ තනතුර බැබළවීමට ක්‍රියා කිරීම අප නාහිමිපාණන් වහන්සේගේ සුවිශේෂී ලක්ෂණයක් විය. ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ කුලපති පදවිය උදාහරණ ලෙස දැක්විය හැකි ය.

ශාසන භාරධාරී මහතෙරපාණන් වහන්සේ නමක් ලෙස ක්‍රියා කළ අප නාහිමිපාණන් වහන්සේ ශාසනික අභිවෘද්ධිය සඳහා ද අනුපමේය මෙහෙවරක් ඉටු කළහ. ස්වකීය පෞද්ගලික ධනය පවා වැය කරමින් රටපුරා වෙහෙර විහාර සංවර්ධනය කිරීමට ද කටයුතු කළහ. බෙල්ලන්විල ශ්‍රී සෝමරතන නාහිමිපාණන් වහන්සේ වෙනුවෙන් වාර්ෂික ව පවත්වන ගුණසමරු පිංකම දිවයිනේ විවිධ ප්‍රදේශවල විහාරස්ථාන කේන්ද්‍ර කොට ගෙන පැවැත්වූ අතර ඊට සමගාමීව එම විහාරස්ථාන සංවර්ධනයට ද ස්වකීය දායකත්වය ලබා දුන්හ. ඊට අමතර ව දිවයිනේ දුෂ්කර ප්‍රදේශයන්හි පිහිටි පාසල් සංවර්ධනයට ද ස්වකීය දායකත්වය දක්වමින් ඇයේ දරුවන්ගේ ගුණ නැණ වර්ධනයට ද දායකත්වය දැක්වූහ.

දෙස් විදෙස්හි පතළ මහතෙරපාණන් වහන්සේ නමක් වූ අප නාහිමියෝ සැම විට ම නිර්භීත ව සිය අදහස් ඉදිරිපත් කිරීමට ද සමත් වූහ. තමා කිසිවකුගෙන් ලාභ ප්‍රයෝජන, වරප්‍රසාද ලබා නොගත් බැවින් ඕනෑ ම අයකුගේ වැරැද්දක් දුටු විට තරාතිරම නො බලා පෙන්වා දීමට හා විවේචනය කිරීමට තරම් පෞරුෂයක් උන් වහන්සේ සතු විය. හැම විට ම අදහස් පළ නො කළ නිසා

ඇතැම් අවස්ථාවල උන් වහන්සේ පළ කළ අදහස වඩාත් ප්‍රබල විය. එබැවින් ජාතික හා ආගමික වශයෙන් රටේ තීරණාත්මක අවස්ථාවල දී උන් වහන්සේගේ මතය විමසීමට හා එය සැලකිල්ලට ගැනීමට තරම් මෙරට පාලකයන් ද ක්‍රියා කර ඇත.

ශාස්ත්‍රීය වශයෙන් ද වටිනා සේවයක් උන් වහන්සේගෙන් ඉටු වූ අතර සංස්කෘතික වශයෙන් ද මෙරට සාම්ප්‍රදායික සංස්කෘතිකාංග ආරක්ෂා කිරීමට ද උන් වහන්සේ ස්වකීය කාලය, ශ්‍රමය හා ධනය වැය කළහ.

සංඝ සෝභන ගුණයෙන් ද ශාස්ත්‍ර විශාරදත්වයෙන් ද නිර්මාණශීලීත්වයෙන් ද සරල දිවි පෙවෙතකින් ද හෙබි උන් වහන්සේ සිරිලක සම්බුදු සසුන් සිංහල සංස්කෘතිත් භාෂා සාහිත්‍යයත් පෝෂණය කිරීමෙහි ලා අමිල මෙහෙවරක් ඉටු කළ මහා යතිවරයාණන් වහන්සේ නමක් වූ බැවින් උන් වහන්සේගේ හදිසි අපවත් වීම සමස්ත ජාතියට ම පිරිමැසිය නොහැකි පාඩුවක් ලෙස ද දැක්විය හැකි ය.

**මහාචාර්ය මාගම්මන පඤ්ඤානන්ද ස්ථවිර**

අධ්‍යයනාංශ මහාචාර්ය
පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

# අනුස්මරණීය ජාතික කාර්යභාරයක නියැලි අපේ කුලපති බෙල්ලන්විල විමලරතන අනුනාහිමිපාණන් වහන්සේ

ශ්‍රී ලාංකික භික්ෂුව වනාහි දෙස බස රැස සමය යන සිවු කරුණ ද සිය උර දරා සිවුරු දරන උත්තම පුරුෂයෙකි. උන්වහන්සේ අභිප්‍රාය වශයෙන් සබ්බදුක්ඛ නිස්සරණයෙහි සපථ කොට පැවිද්දට එළඹිය ද ශාසන සංරක්ෂණ වගකීම විෂයෙහි මහදුත්සාහයෙන් ව්‍යාවෘත වන්නෙකි. ශාසනය රැඳී පවත්නේ ජාතිය මත බව උන් වහන්සේ හඳුනති. එබැවින් ජාතියෙහි ආරක්ෂාව පිණිස කැලම අවධානය යොමු කරති. ජාතියේ පැවැත්ම දේශයේ පැවැත්ම මත රඳා පවතින්නකි. එබැවින් දේශයේ අභේද්‍යභාවය විෂයෙහි නිරන්තරයෙන් සාපේක්ෂ වෙති. ජාතියේ හා දේශයේ අනන්‍යතාව නම් භාෂාව හා සංස්කෘතිය යි. එබැවින් හෙළ සංස්කෘතිකාංග සුරක්ෂිත කර ගැනීමට මෙන් ම භාෂාවේ අක්මුල් වැනසී යා නො දී සුරැකීමට ද උන් වහන්සේ පෙරමුණ ගනිති. දෙසත් බසත් රැසත් රැක ගැනීමෙන් ම සසුනේ සුරක්ෂිතභාවය තහවුරු වන බව ජානගත ව ම විජානනය කොට ගත් ශ්‍රී ලාංකික භික්ෂූන් වහන්සේ සෙසු ථේරවාදී භික්ෂූන් වහන්සේගෙන් කැලම වෙනස් වූ සුවිශේෂ චරිතයකි.

ලක්දිව භික්ෂුව රජුට උපදේශකයෙකි. පාලකයා යහමග වන් කල්හි ඔහුට ආශීර්වාද කළා පමණක් නොව ඔහු බෝධිසත්ත්ව භූමියෙහි ලා ගරු කිරීමට ජනතාව පොලඹවයි. රටට හිතැති රජුන්ට උවදුරක් උපන් කල පිණ්ඩපාතයෙන් හෝ ඔහු පෝෂණය කිරීමටත්, සිවුර තුළ හෝ ජීවිතාරක්ෂාව සැලසීමටත් උන් වහන්සේ නොපසුබට ය. පාලකයා වැරදි මඟ පිළිපන් කල්හි පත්තනික්කුජ්ජනයෙන් පවා දඬුවම් කිරීමටත්, ඔහු ආයති සංවරයෙහි නො පිහිටන්නෙක් නම් සිහසුනෙන් නෙරපීමටත් උන් වහන්සේ පසුබට නො වෙති. කොටින්ම සිරිලක රාජ්‍යත්වය පිළිබඳ සුවිශේෂ ම පසුබිම් බලවේගය භික්ෂූන් වහන්සේ යි.

මිහිඳු මාහිමියන් දෙවනපෑතිස් නිරිඳුන්ට පවසන්නේ ඔබතුමන් රටේ තාවකාලික භාරකරුවා මිස හිමිකරුවා නො වන බව යි. රජුගේ කාර්යභාරය වනුයේ මිනිසා සතා සීපාවා ගස්වැල් සහිත සකල ධරණීතලය ම දැහැමින් ආරක්ෂා කොට තැබීම යි. නර රූපයෙන් මහා දෙවියෙකුගේ පෙනී සිටීමක් ලෙස එවන් රජුන් පිළිබඳ ව පෙරදිග වැසියා පිළිගනී. එසේ ම බෝධිසත්ත්වයෙකු වීමට හෝ වසලයෙකු වීමට ඔහුට ඇති හැකියාවත් පාලකයෙකු ව දෙව්ලොව යාමට හෝ නිරාගත වීමට ඇති භව්‍යතාවත් ධර්මානුකූල ව පහදා දුන්නෝ භික්ෂූන් වහන්සේ ම ය. නොබෝසතුන් මෙරට පාලකයන් නො විය යුතු බව සම්මත වන්නේ මෙම ඓතිහාසික චින්තන පදනම මත පිහිටා සිටිමිනි.

ථේරපුත්තාභය හිමියන් සිවුරු හැර දුටුගැමුණු යුද පෙරමුණේ සෙන්පතියෙකු ව ගමන් කළේ සම්බුදුසසුන සුරැකීමට නම් රට ජාතිය ආරක්ෂා වී පැවතිය යුතු ය යන භූමි යථාර්ථය පසක් කොට ගත් බැවිනි. මහානාම හිමියන්, කුඩාපොළ හිමියන්, වාරියපොළ හිමියන්, මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමියන් මෙන් ම මෑත වැඩ සිටි දිඹුලාගල නාහිමියන්, මඩිහේ නාහිමියන්, සෝම හිමියන් ද සිය ජාතික කාර්යභාරය නිරන්තරයෙන් දිවි දෙවැනි කොට ඉටු කෙළේ භික්ෂුවගේ ප්‍රවේණිගත වගකීම පිළිබඳ ව පැවැති අවබෝධය හේතුවෙනි.

බෙල්ලන්විල විමලරතන අනුනාහිමිපාණන් වහන්සේ ද යථෝක්ත සඟපෙළෙහි වත්මන් නියෝජනය වෙති. යථෝක්ත ශ්‍රී ලාංකික ථේරීය භික්ෂු සම්ප්‍රදායයෙහි උරුමයෙන් හෝ වගකීමෙන් හෝ බැහැර නො වූ, සිය ජාතික මෙහෙවර මනා ව අවබෝධ කොට ගෙන ක්‍රියා කළ යතිවර ලකුණක් ඉතිරි කළ භික්ෂුවක ලෙස බෙල්ලන්විල හිමියන් ඉතිහාසයට එක් වනු ඇත.

විමලරතන හිමියන් තාරුණ්‍යයට එළඹෙන්නේ විසි වන සියවසේ මැද භාගයත් මඳක් පසු කොට ය. තද් යුගයේ හට ගත් දේශපාලන පරිවර්තනයත් ඒ සමග ම මතු වී එන නව ජාතික චින්තනයේ ආභාසයෙන් සුපෝෂිත ව අධ්‍යාපනය ලබන්නට උන් වහන්සේට අවස්ථාව උදා වෙයි. 56 සමාජ පෙරළියේ ඇසුර

ලබන උන්වහන්සේට 77 සමාජ විපර්යාසය ද සියැසින් දැක ගත හැකි වෙයි. අනගාරික ධර්මපාල චින්තනය මතින් ජීවය ලැබූ එහෙත් තිඹිරිගෙයි දී ම නව ධනවාදී විවෘත ආර්ථික ක්‍රමයෙහි හා ඊට ම සැසඳෙන කාමභෝගී සංස්කෘතික ප්‍රවාහයේ බලපෑමෙන් මියැදෙන දේශයේ අනාගත බලාපොරොත්තු විසි වන සියවසේ අග භාගයේ උපන් අපට වඩා සංවේදී ව දකින්නට උන් වහන්සේට හැකි විය.

පිරිවෙන් අධ්‍යාපනයෙන් ලද ශාස්ත්‍රීය ශික්ෂණයත්, විශ්වවිද්‍යාල අධ්‍යාපනයෙන් ලද විචාරශීලීත්වයත් පැවිදි උරුමයෙන් ලද අදීන චින්තනයත් සිය විහාරස්ථානයෙන් මෙන් ම ගුරු ඇසුරෙන් ද ලද අකුටිල භාවයත් එක ම පෞරුෂයකට කාවැදී ගත් පිළිරුවක් බෙල්ලන්විල නාහිමියන් වෙතින් නිරන්තරයෙන් නිරූපණය වන්නේ ඉහත දක්වන ලද සමාජ විපර්යාසයට එරෙහි ව සටන් වැදීමට ලක්මව විසින් ම නිමවන ලද කාලීන චරිතයක ලක්ෂණ දරමිනි.

56 පෙරළියෙන් පසු ව එන දසක හයකට සමාසන්න සියලු ම අභියෝගාත්මක අවස්ථාවන්හි බෙල්ලන්විල හිමියන්ට රටේ ජාතික ආගමික ආරක්ෂාව වෙනුවෙන් ප්‍රගතිශීලී කාර්යභාරයක් ඉටු කිරීමට හැකි විය. ඇතැම් භික්ෂූන් ලාභ ලෝභ ඉදිරියේ දේශද්‍රෝහීන් ලෙස දුර්නාමයන් ලබද්දී දේශප්‍රේමියෙකුගේ කාර්යභාරය ඉටු කරමින් ජීවිත තර්ජන පවා ලබමින් පෙරමුණෙහි වැඩමවීමට උන්වහන්සේට හැකියාව ලැබුණි.

යටත්විජිත යුගයේ අවසන් වසර කිහිපය මෙන් ම බෙදුම්වාදී ත්‍රස්ත අරගලයේ සමස්ත තිස් වසරක කාලපරිච්ඡේදය නියෝජනය කරන උන්වහන්සේගේ ජීවිත කාලය සැබවින් ම නිදහසේ හෝ සෞභාග්‍යයේ හෝ සුව විඳීමට නො ව නිදහස හා සෞභාග්‍යය වෙනුවෙන් සටන් වැදීමට ජාතියට ම සිදු වූ දුර්දසාපන්න යුගයකි. බඩගෝස්තරවාදී පරගැත්තන් විසින් ආපස්සට අදින ජාතික රැහැනේ ප්‍රගතිශීලී පක්ෂය ආකර්ෂණය කිරීම උන් වහන්සේගේ මහණකම බවට පත් විය.

බෙල්ලන්විල රාජමහා විහාරස්ථානය ලක්දිව සුවිශේෂ ආයතනයන් අතර එකකි. සිය විහාරස්ථානය මුල් කොට ගෙන

දැයේ දරුවන් දහස් ගණනකට රැකියා සැපයීමේ කාර්ය භාරය ඉටු කිරීමට බෙල්ලන්විල ප්‍රජා සංවර්ධන පදනමට හැකියාව උදා වන්නේ විමලරතන හිමියන්ගේ ජාතික චින්තනයේ ම ප්‍රතිඵලයක් ලෙසිනි. කොතෙත් ප්‍රදර්ශනාත්මක ව්‍යාපෘති නිර්මාණය කළ ද පුද්ගලයා නගා සිටුවීමෙන් හැර රටක අභිවර්ධනයක් අපේක්ෂා කළ නො හැකි බව උන්වහන්සේ තරයේ විශ්වාස කළහ.

රට දැය සමයේ සැබෑ සුරක්ෂිත භාවය ගොඩ නැගෙන්නේ හමුදා බණ්ඩයන්ගෙන් හෝ පවුරු පදනම් මඟින් නො ව සංස්කෘතිය හරහා ය. එබැවින් සංස්කෘතික ප්‍රවර්ධනය විෂයෙහි උන්වහන්සේ කලායතන ආදිය පිහිටුවා කටයුතු කළා පමණක් නො ව දිවයිනේ සුප්‍රකට කලා කෘතියක් වන බෙල්ලන්විල පෙරහැර වෙනුවෙන් සිය ශ්‍රමය ඉතා අභිරුචියෙන් දානය කළහ.

පශ්චාත් යුද්ධ සමයක් පසු කරන ලක්දිව සංහිඳියාව වෙනුවෙන් සාධනීය කාර්යභාරයක් ඉටු කිරීමට බෙල්ලන්විල නාහිමියන් මහත් උත්සාහයක් දැරූ බව කවුරුත් දන්නා කරුණකි. එහි දී මතුපිටින් බොහෝ දෙනා නොදන්නා ශාස්ත්‍රීය දැක්මක් උන් වහන්සේ වෙත පැවැති බව දන්නේ ළඟින් ඇසුරු කළ කිහිප දෙනෙකු පමණි. එබැවින් උන්වහන්සේ නොයෙක් විට පටු මිනිසුන්ගේ දෝෂ දර්ශනයට ද ලක් වූ බව අපි දනිමු. 'බුදුදහම හා සමාජ සේවය', 'ශ්‍රී ලංකාවේ බුදුදහම හා ජනවාර්ගික අර්බුදය', 'බහුතරයේ හා සුලුතරයේ අනන්‍යතාව', 'ආගමික විවිධත්වය වටහා ගැනීම' හා 'ජාතික සමගියේ වටිනාකම' වැනි මාතෘකා යටතේ ශාස්ත්‍රීය ලිපි සැකසීමට මෙන් ම දේශීය හා ජාත්‍යන්තර සමුලු ඇමතීමට උන් වහන්සේ කටයුතු කළේ බුදුහිමියන්ගේ සැබෑ ශ්‍රාවකයෙකුගේ ගතිගුණ හිස දරා ගෙන මිස ගැලරිය සතුටු කරන පුහු වීරයෙකු වශයෙන් නොවේ.

උන් වහන්සේ නියෝජනය කළේ දේශද්‍රෝහී පිලෙහි ලගිමින් සුළුජාතික වරප්‍රසාද ලබා ගනිමින් අදත් ජාතියට වින කරන අවියත් සමාජය නොවේ. රටේ ඒකීයභාවය සුරක්ෂිත කර ගැනීමෙහි ලා නිරන්තරයෙන් ම ප්‍රගතිශීලී පිල නියෝජන කිරීමට උන්වහන්සේ ක්‍රියා කළහ. වරක් රටට බිලියන ගණනක පාඩුවක්

සිදු කළ බැඳුම්කර වංචාව ගැන ජනපතිතුමන් ඉදිරියේ කළ අභීත ප්‍රකාශයත් නව ව්‍යවස්ථාව හරහා බෙදුම්වාදයට ලක්මව ගොදුරු වන බව පන්වා දෙමින් මනෝ ගනේෂන් අමාත්‍යවරයා ඉදිරියේ කළ ශාස්ත්‍රීය දේශනයත් සමස්ත දේශප්‍රේමීන්ගේ ම ගෞරවය උන් වහන්සේ වෙත වඩවඩාත් හිමි වීමට හේතු විය.

පුරාවස්තු විනාශය, වන්ධ්‍යාකරණය, වෙහෙරවිහාර ඉඩකඩම් අන්‍යාගමිකයන් විසින් පැහැර ගැනීම, විවිධ උපක්‍රම හමුවේ සිංහල ජාතිය වඳ වී යාම, ගබ්සාව ආදිය ගැන සමාජය අවදි කිරීමට උන් වහන්සේ ක්‍රියා කළා සේ ම ලංකා ජාතික පුනරුද සභාවේ උපදේශකයාණන් වහන්සේ ලෙස අපරිමිත කාර්යභාරයක් ජාතිය වෙනුවෙන් ඉටු කළහ.

සෑම අවස්ථාවක ම අභීත ව අදහස් ඉදිරිපත් කිරීමේ ගුණය උන් වහන්සේ සතු වූ අතර එහි ලා තමන්ට සිදු වන පාඩුව හෝ පුද්ගලික අමනාපකම් හෝ ගැන සැලකීමක් උන් වහන්සේ තුළ නො වී ය. මෙනයින් ගත් කල්හි දෙදහස් පන්සිය වසකට සමාසන්න ඓතිහාසික භික්ෂු මෙහෙවරෙහි නූතන ආවිර්භාවයක් ලෙස මහාචාර්ය බෙල්ලන්විල විමලරතන අප කුලපති අනුනාහිමියන් සලකා ගැනීම අතිශයෝක්තියක් නොවේ.

**මහාචාර්ය රාජකීය පණ්ඩිත මැදගොඩ අභයතිස්ස ස්ථවිර**

**පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය**

# සමාජ සුධාරකයකු වූ ශාස්ත්‍රඥ යතිවරයාණෝ

බෙල්ලන්විල විමලරතන අනුනාහිමියන් විද්‍යෝදය විශ්වවිද්‍යාලය යුගයෙහි සිට ශාස්ත්‍රඥාන විතරණයෙහි හා සමාජ ප්‍රගමනයෙහි නියැලෙමින් ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය ශෝභාවත් කළ විද්වත් යතිවර පරපුරෙහි අවසන් පුරුක සේ හැඳින්විය හැකි ය.

1942 දී ජන්ම ලාභය කොට 1956 දී ප්‍රව්‍රජ්‍යා භූමියට ප්‍රවිෂ්ට වූ විමලරතන හිමියන්ට විද්වත් සංඝ සමාජයෙහි ප්‍රභූත්වයට පත් වීමෙහි ලා මොල්ලිගොඩ ශ්‍රී ප්‍රවචනෝදය පිරුවන් විද්‍යායතනයෙන් ලැබුණු සාම්ප්‍රදායික අධ්‍යාපන උරුමය මෙන් ම විද්‍යාලංකාර හා විද්‍යෝදය යන නව විශ්වවිද්‍යාලය සම්ප්‍රදායන්ගෙන් ලැබුණු ශික්ෂණයත් මහෝපකාරී වූ බව නිසැක ය.

විද්‍යාලංකාරයේ දී ශිෂ්‍ය සංගම් ව්‍යාපාරයට සම්බන්ධ වූ උන් වහන්සේ 1964 දී විද්‍යාලංකාර මහා ශිෂ්‍ය සංගමයේ සභාපති ධුරයට පත් වූහ. එහෙත් උන් වහන්සේ ශිෂ්‍ය ව්‍යාපාරයෙහි සුලභ ව හමු වන වේදිකා පුපුරවන දේශපාලන භික්ෂුවක නො වී ශාස්ත්‍රවන්ත යතිවරයාණ කෙනකු මෙන් ශිෂ්‍ය ව්‍යාපාරයේ ප්‍රගමනයට දායක වූ බව සඳහන් කළ යුතු වෙයි. ශාස්ත්‍රීය කාර්යයන් කෙරෙහි මේ තරුණ යතිවරයාණන් වහන්සේගේ ආසක්තභාවය පෙන්නුම් කරන මහඟු සාධකයක් වන්නේ එතුමන් විසින් සංස්කරණය කරන ලද **ලේඛන සිඛා** ශාස්ත්‍රීය සංග්‍රහය යි.

විද්‍යාලංකාරයෙන් ශාස්ත්‍රවේදී උපාධිය ලැබූ තරුණ විමලරතන හිමියෝ කෙටි කලක් පැපිලියාන සුනේත්‍රා මහා දේවී පිරුවන් විද්‍යායතනයෙහි ආචාර්ය මණ්ඩලයෙහි සේවය කළහ. අනතුරු ව උන් වහන්සේ රත්මලානේ පරමධම්මචේතිය මහ පිරුවනෙහි විද්‍යාලයාධිපති ධුරයට පත් කරනු ලැබූහ. රත්මලානේ

භික්ෂු අභ්‍යාස විද්‍යාලයේ කථිකාචාර්යවරයකු වශයෙන් ද උන් වහන්සේ කලක් සේවය කළහ. එවක විද්‍යෝදය විශ්වවිද්‍යාලය නමින් කීර්තියට පත් ව තිබූ වර්තමාන ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයයෙන් ශාස්ත්‍රවේදී ගෞරවෝපාධිය ලබා ගැනීම සඳහා අධ්‍යයන කටයුතුවල නිමග්න වූයේ මේ අතර වාරයේ ය.

දේශීය අධ්‍යාපන සම්ප්‍රදායයන්ගෙන් පෝෂණය ලබා විද්වද් ලෝකයට පිවිසුණු බෙල්ලන්විල හිමියෝ ඉන් අනතුරු ව විශ්ව ශික්ෂණ සම්ප්‍රදාය ගවේෂණය කරමින් එක්සත් රාජධානියේ ලැන්කැස්ටර් විශ්වවිද්‍යාලයට ඇතුළත් ව ආචාර්යෝපාධිය සඳහා පර්යේෂණ කාර්යයෙහි නිරත වූහ. උන් වහන්සේගේ ආචාර්යෝපාධි නිබන්ධය වූයේ *The Mahâ Puruṣa Concept in Buddhist Literature and Iconography* යන කෘතිය යි. ඒ සඳහා 1977 දී ආචාර්ය උපාධිය පිරිනැමිණි. පසු ව 1994 දී මෙය *Concept of Great Man: (Mahâpurisa) in Buddhist Literature and Iconography* මැයෙන් සිංගප්පූරුවෙහි දී මුද්‍රණයෙන් ප්‍රකාශයට පත් කෙරිණි. පසු ව උන් වහන්සේ විසින් මේ කෘතිය **බෞද්ධ මහා පුරුෂ සංකල්පය** මැයෙන් සිංහලයට නඟා පළ කරන ලදි.

1980 දී ආචාර්ය බෙල්ලන්විල විමලරතන හිමියන්ට ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයයේ පාලි හා බෞද්ධ අධ්‍යයන අංශයේ කථිකාචාර්ය ධුරයක් හිමි විය. ශාස්ත්‍රීය ග්‍රන්ථ සම්පාදනයෙහි ලා උන් වහන්සේ සතු වූ කුසලතාව ඔප් නැංවෙනුයේ මේ පත් වීමත් සමඟ බව පැවසිය යුතු ය. ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ නගරයෙහි අභිනවයෙන් ඉදි කෙරුණු පාර්ලිමේන්තු මන්දිරයෙහි නිදන් වස්තු තැන්පත් කිරීමේ උළෙල (1980 සැප්තැම්බර් 22) නිමිත්තෙන් ආචාර්ය චන්ද්‍ර වික්‍රමගමගේ සමඟ සම සංස්කාරකත්වයෙන් පළ කරන ලද **ශ්‍රී ජයවර්ධනපුරඃ එදා අද සහ හෙට**, 1984 දී ප්‍රකාශිත **බෞද්ධ සම්ප්‍රදාය හා සංස්කෘතිය**, 1989 දී ප්‍රකාශිත **බුදු දහම සහ වෙනත් ආගම්** විමලරතන හිමියන්ගේ ග්‍රන්ථකාරක ජීවිතයෙහි මුල් යුගය නියෝජනය කරයි.

බෞද්ධ කලා ශිල්ප හැදෑරීමට අවශ්‍ය විමර්ශනාත්මක ග්‍රන්ථ සම්පාදනය උන් වහන්සේගේ විශේෂ ශාස්ත්‍රීය සම්ප්‍රදානයක් සේ හැඳින්විය හැකි ය. බුදුසමය හා සම්බන්ධ පූජනීය වස්තු අතර ප්‍රමුඛස්ථානය හිමි කොට ගන්නා බුද්ධ ප්‍රතිමාව සම්බන්ධයෙන් එහි ලා උන් වහන්සේගේ විශේෂාවධානය යොමු වී තිබේ. **බුදු පිළිමයඃ මුද්‍රා සහ ආසන** (1991) හා **බුද්ධ ප්‍රතිමා කලාව හා බුදු පිළිමයේ විකාශය** (1995) මේ යටතේ විශේෂයෙන් දැක්විය යුතු කෘති ද්වයයකි. මීට අමතර ව පාලි මූල ග්‍රන්ථ කිහිපයක් හා බුදුසමය අළලා විදේශිකයන් විසින් සම්පාදිත කෘති කිහිපයක් සිංහලයට නඟා පළ කිරීමෙන් ද විමලරතන හිමියෝ සුවිශාල ශාස්ත්‍රීය සේවාවක් ඉටු කළහ. බුදුසමයේ හරය නූතන විශ්ව ප්‍රජාවට අනාවරණය කෙරෙමින් සම්පාදිත ජෝන් වෝල්ටර්ස්ගේ *Mind Unshaken* කෘතිය උන් වහන්සේ විසින් සිංහලයට නඟන ලද එක් කෘතියකි. **නොසැලෙන මනස** මැයෙන් වන එම පරිවර්තනය 1992 දී ප්‍රකාශයට පත් කරන ලදි.

විමලරතන හිමියෝ සමයාන්තර අධ්‍යයනය කෙරෙහි විශේෂාවධානය යොමු කළ විද්වතෙකි. 1989 දී ප්‍රකාශිත **බුදු දහම සහ වෙනත් ආගම්** මේ මාර්ගයෙහි යමින් උන් වහන්සේ විසින් සම්පාදිත මුල් ම කෘතිය වන අතර වර්ෂ 2000 දී එම කෘතිය *Buddhism Among Other Religion* මැයෙන් ඉංගිරිසියෙන් ප්‍රකාශයට පත් කෙරිණි. හූස්ටන් ස්මිත්ගේ කෘතියක් අනුවාදය කරමින් **මිනිසාගේ ආගම් - 1 බුද්ධාගම** (1999) මැයෙන් පළ කරන ලද කෘතිය එහි දෙවන පියවර සේ හැඳින්විය හැකි ය.

උන් වහන්සේ සතු සමයාන්තර ඥානය හේතුවෙන් සමකාලීන විද්වත් පර්ෂදයන්හි ප්‍රමුඛස්ථානයක් උන් වහන්සේට නිතැතින් ම හිමි විය. මෑත භාගයේ දිවයිනේ ආගමික නොසන්සුන්කම් ඇති වූ අවස්ථාවන්හි උන් වහන්සේට සමාජ සුධාරකයකු වසයෙන් සාධනීය ලෙස මැදිහත් වීමට හැකි වූයේ මේ සමයාන්තර ඥානයෙහි විශිෂ්ටත්වය විසින් සුනිශිත මනසකින් ලෝකාවලෝකනයෙහි උන් වහන්සේ සතු සාමර්ථ්‍යය හේතුවෙන් බව පැවසිය යුතු ය. මෑත භාගයේ අන්තර් ආගමික සහයෝගිතාව

වෙනුවෙන් විශිෂ්ටතම දායකත්වය පළ කළ යතිවරයාණන් වසයෙන් උන් වහන්සේට කීර්තියක් අත් වන බව ද වෙසෙසින් සඳහන් කළ යුතු වෙයි.

සමය සමයාන්තර ඥානය මෙන් ම තදනන්‍ය ශික්ෂණ මාර්ගයන් ද ආශ්‍රයෙන් බුදුසමයේ ඉගැන්වීම් සමාජගත කිරීම විමලරතන හිමියන්ගේ ශාස්ත්‍රීය කාර්යාවලියේ තවත් මුහුණුවරක් සේ හැඳින්විය හැකි ය. *Buddhism Society and Environment* මැයෙන් 1989 දී ප්‍රකාශිත පුස්තිකාව හා 2006 දී ප්‍රකාශිත **බුදු දහමඃ සාහිත්‍ය කලාව** කෘතියත් ඊට නිදසුන් වෙයි. **බෞද්ධ පුදපූජා සංස්කෘතිය, බුදු පිළිමයට පෙර බුදු හාමුදුරුවෝ** හා **බුදුවරු සහ බෝසත්වරු** යන කෘති මඟින් උන් වහන්සේ ථේරවාද හා මහායාන බුදුසමය හා බෞද්ධ දර්ශනයත් බෞද්ධ කලා ශිල්පත් සම්බන්ධයෙන් තමන් සතු පෘථුල ඥාන සම්භාරය වඩාත් පුළුල් පාඨක පිරිසක් කරා ගෙන යෑමෙන් ධර්මශාස්ත්‍රෝන්නතිය විෂයයෙහි දැක්වූ දායකත්වය සදානුස්මරණීය වෙයි.

ශාස්ත්‍රඥයකු හා විශ්වවිද්‍යාලයීය ආචාර්යවරයකු වසයෙන් ඉටු කළ සේවාවට අමතර ව සමාජ ශෝධනය හා තරුණ පරපුර සත්සමාජගත කිරීමෙහි ලා උන් වහන්සේ දැක්වූ දායකත්වය ද විද්වතුන්ගේ ප්‍රශංසාත්මක ඇගයීමට ලක් වූවකි. බෙල්ලන්විල රාජ මහා විහාරය කේන්ද්‍ර කොට ගනිමින් සිදු කරන සමාජ කාර්යයන් අතුරෙන් බෙල්ලන්විල ප්‍රජා සංවර්ධන පදනම මඟින් තරුණ ජනයාට විවිධ ශිල්පයන්හි නිපුණත්වය හා සමාජ සංස්කෘතික සංවේදිතාව ඇති කිරීමට උන් වහන්සේ ගෙන ගිය කාර්යාවලිය සමකාලීන සමාජ ඉතිහාසය ලිවීමේ දී වෙසෙසින් සඳහන් කළ යුතු වෙයි.

ශාස්ත්‍රීය හා සමයානුගත විද්වතකු වූ උන් වහන්සේ කලා විචාරකයෙක් ද සුශික්ෂිත කලා රසිකයෙක් ද වූහ. එහි විශිෂ්ට ඵලය ලාංකේය සමාජයට තිළිණ කෙරුණේ සෝමබන්ධු විද්‍යාපතීන් ලවා බෙල්ලන්විල රාජ මහා විහාරයෙහි නිමවන ලද විශිෂ්ට චිත්‍ර කලා නිර්මාණාවලියෙනි. එය බෙල්ලන්විල විමලරතන හිමියන්ගෙන් හෙළ කලා ලෝකයට ලැබුණු මහාර්ඝ දායාදයක් බව පවසනු වටී.

මෑත අවධියෙහි බොහෝ යතිවරුන් වරදානාපේක්ෂාවෙන් සමාජ අසාධාරණය හා අයුක්තිය හමුවේ මුනිවත රකින බවට හා දේශපාලන බලවේග හමුවේ හැකිළී පැකිළී වැඩවාසය කරන බවට විවිධ පාර්ශ්වයන්ගෙන් චෝදනා එල්ල වෙමින් පවතී. එසේ ද වුව බෙල්ලන්විල විමලරතන අනුනාහිමියන් සමාජ සාධාරණත්වය හා යුක්තිය වෙනුවෙන් නිශ්ශරණාධ්‍යාශයෙන් යුතු ව අභීත ව සිය හඬ අවදි කළ බව ද උන් වහන්සේට විශේෂ ගෞරවයක් වසයෙන් සඳහන් කළ යුතු ය.

**ජ්‍යෙෂ්ඨ මහාචාර්ය රත්නසිරි අරංගල**

අංශාධිපති - සිංහල හා ජනසන්නිවේදන අධ්‍යයනාංශය

# නාහිමි සමිඳු බෙල්ලන්විල විමල රුවන්
# අත් වේවා පතුමු නොමියෙන සුවය නිවන්

''ගුණයට මිසක බලයට හෝ නිලට ලොවේ

ගරු කටයුතු ද තුති පුද දිය යුතු ද නොවේ''

ටිබෙට් ජාතික එස්. මහින්ද හිමියන්ගේ යථෝක්ත කාව්‍යෝක්තිය සිය ජීවිතාදර්ශයෙන් ම ප්‍රකාශයට පත් කළ අපේ යුගයේ මහා යතිරුවන අතිපූජ්‍ය මහාචාර්ය බෙල්ලන්විල විමලරතන අනුනායක කුලපති ස්වාමීන්ද්‍රයන් වහන්සේ නික්ම ගියහ. ඒ වූ කලි උන්වහන්සේ ඇසුරු කළ - නොකළ සුවිසල් පිරිසකට දැනුණු - දැනෙන නික්ම යාමකි.

උන් වහන්සේ තමාට නිවැරදි යැයි දැනුණු දෙය වෙනුවෙන් නිබඳ පෙනී සිටියහ. ආර්ජව ගුණය එනම් ඍජුභාවය උන් වහන්සේගේ චරිතයෙහි අප දුටු සුවිශේෂ චරිත ලක්ෂණයකි. සිය අදහස් සිංහලයෙන් වේවා ඉංග්‍රීසියෙන් වේවා ඕනෑ ම සභාවක් අබිමුව පැහැදිලි ව ප්‍රකාශ කිරීමේ ශක්‍යතාව උන්වහන්සේ සතු විය. දේශයට අහිමි ව ගියේ ලෝකයට අහිමි ව ගියේ ගුණධර - ධර්මධර - බහුශ්‍රැත මේ මහා යති පඬිරුවන යි.

අසූව දශකයේ ආරම්භයත් උන්වහන්සේගේ සරසවි ගුරු ජීවිතයේ ආරම්භයත් අපගේ සරසවි ශිෂ්‍ය ජීවිතයේ ආරම්භයත් සිදු වන්නේ එකට ය. මා සංස්කෘත භාෂා සාහිත්‍යය හදාරන බව ඇසූ, පාලි භාෂා සාහිත්‍යය පිළිබඳ මේ ප්‍රාමාණික යතිවරයාණෝ අපට ආශීර්වාද කළහ. හඳුනා ගත් දවසේ පටන්, අප නාහිමියන්ගේ කායික සමුගැන්ම සිදුවන තෙක් උන්වහන්සේ අපට සමීප ව ඇසුරු කරන්නට ලැබිණි.

පියවරෙන් පියවර කථිකාචාර්ය, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, සහාය මහාචාර්ය, මහාචාර්ය යන තනතුරුවලට පත් වෙමින් ආ

උන්වහන්සේ විශ්‍රාම යාමෙන් පසු පෙරළා තමා ඉගැන් වූ සරසවියට යළි වැඩම කෙළේ සරසවි පද්ධතියේ උපරි ආසනය වන කුලපති ධුරයට භාග්‍යවත් වෙමිනි. ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ප්‍රථම කුලපතිවරයා වූයේ මෙරට සුවිශිෂ්ට චින්තකයකු වූ ආචාර්ය ඊ. ඩබ්ලිව් අදිකාරම් මැතිතුමා ය. එතුමාගෙන් පසු එම නතතුරට පත් වූයේ විද්වත් - ගුණවත් ස්ත්‍රී රත්නයක වූ ආචාර්ය විමලා ද සිල්වා මැතිනිය යි. තෙවනු ව එම තනතුරින් පිදුම් ලදුයේ සිය ආධිපත්‍යය යටතේ තිබූ සඟ සතු මහා බිම්කඩ, අප සරසවියේ ප්‍රථම උපකුලපති වැලිවිටියේ ශ්‍රී සෝරත නාහිමියන්ගේ ඉල්ලීම පරිදි ගුරු පූජාවක් ලෙස සරසවිය සතු කළ අතිපූජ්‍ය ආචාර්ය මැදගොඩ සුමනතිස්ස ස්වාමීන්ද්‍රයන් වහන්සේ ය. අනතුරුව සිය අපවත් වීම සිදු වන තෙක් මේ විසල් තනතුර ආලෝකවත් කළෝ අතිපූජ්‍ය මහාචාර්ය බෙල්ලන්විල විමලරතන නාහිමිපාණෝ ය.

ශ්‍රී ජයවර්ධනපුර - විද්‍යොදය විශ්වවිශ්වවිද්‍යාලයේ කුලපති තනතුරින් සැමදා පිදුම් ලැබුයේ ගිහි හෝ පැවිදි වේවා බරක් ඇති, නමක් ඇති, සම්භාවනීය - සුවිශේෂ චරිතයකි. අද ඒ අසුන හිස් ය. මේ හිස් තැන පිරවිය යුත්තේ උගත්කමත් ගුණවත්කමත් ඇති, දේශපාලන ගැතිකමක් නැති, අභීත උත්තම චරිතයකින් යැයි අපි විශ්වාස කරමු. ඒ වූ කලි අපට රටට මෙන් ම ලොවට අහිමි ව ගිය අපගේ කුලපති හාමුදුරුවන් වහන්සේට කළ හැකි විශිෂ්ටතම ගෞරවය යි.

අතිපූජ්‍ය අනුනායක මහාචාර්ය බෙල්ලන්විල විමලරතන අපේ කුලපති ස්වාමීන්ද්‍රයන් වහන්සේට නිවන් සුවය ම අත් වේවා !

**මහාචාර්ය සමන් චන්ද්‍ර රණසිංහ**

සංස්කෘත පිළිබඳ මහාචාර්ය -භාෂා, සංස්කෘතික අධ්‍යයන හා ප්‍රාසංගික කලා අධ්‍යයනාංශය,

## අප දුටු කුලපති නාහිමි

කොළඹ, මාළිගාකන්දේ විද්‍යෝදය පිරිවෙන මුල් කොට බිහි වූ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ කුලපති ධුරීණ අතිගරු මහාචාර්ය බෙල්ලන්විල විමලරතන අනුනාහිමිපාණන් වහන්සේ ජාතික හා ආගමික වශයෙන් උද්ගත වූ ගැටලුකාරී තත්ත්වයන්හි දී නිවැරදි මාවතක ගමන් කළ, පටු ලාභ හමුවේ ස්වකීය හෘද සාක්ෂිය බිලි නො දුන් පටු දේශපාලන දෘෂ්ටිකෝණයන්හි නො පිහිටා සිය අදහස ඍජු ව ප්‍රකාශ කළ උජුපටිපන්න ගුණයෙන් යුතු සංඝපිතෘවරයෙකි. මෙනිසා ම උන්වහන්සේ ත්‍රෛනිකායික මහාසංඝරත්නයේ ම ගෞරවාදරයට පත් වූහ. කිවයුත්ත නො බිය ව ප්‍රකාශ කිරීම උන් වහන්සේගේ ජීවිතයෙහි දක්නට ලැබුණු විශේෂ ලක්ෂණයකි.

**දර්ශනපති බලන්ගොඩ සෝභිත නායක ස්ථවිර**

විද්‍යාදය පරිවේණාධිපති

ගරු බෙල්ලන්විල විමලරතන නාහිමිපාණන් වහන්සේ විද්‍යාදය විශ්වවිද්‍යාලය සමග අත්‍යන්තයෙන් සම්බන්ධ තෙරපාණ කෙනෙකි. පාලි භාෂා සාහිත්‍යය පිළිබඳ ගෞරවෝපාධියක් අප විශ්වවිද්‍යාලයෙන් ලබාගත් උන්වහන්සේ ශාස්ත්‍රපීඨයට අයත් පාලි හා බෞද්ධ අධ්‍යයනාංශයෙහි කථිකාචාර්යවරයකු වශයෙන් ආචාර්ය මණ්ඩලයට එක් වූහ. මහාචාර්ය තනතුර දක්වා උසස්වීම් ලබා ස්වකීය සේවා කාලය නිම කළ විමලරතන ස්වාමීන්ද්‍රයන් වහන්සේ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ පස් වන කුලපති ධුරයට පත් කරනු ලැබූහ. බෙල්ලන්විල නාහිමිපාණන් වහන්සේ හා අප විශ්වවිද්‍යාලය අතර අවියෝජනීය සම්බන්ධයක් ගොඩනැගී ආයේ එපරිද්දෙනි. ශාස්ත්‍රපීඨය ආරම්භ වන්නට පෙර භාෂා පීඨයේ පීඨාධිපතිවරයා ලෙස සේවය කරන කල්හි මෙන් ම ඉන් පසු ද මට උන් වහන්සේගේ සමීප ආශ්‍රය ලැබිණි. එම ආශ්‍රයෙහි කූටප්‍රාප්තිය අප අතර ඇති වූ දෘඪ මිත්‍රත්වය යි. උන් වහන්සේ පාලි හා බෞද්ධ අධ්‍යයනාංශයේ අංශප්‍රධානත්වය ආදි පරිපාලන

තනතුරු දරමින් විශ්වවිද්‍යාලයේ දියුණුවට ක්‍රියා කළ ආකාරය මට දනුදු සිහි වෙයි. බෙල්ලන්විල නාහිමියන්ගේ අපවත් වීමෙන් සිංහල, පාලි, සංස්කෘත යන පෙරදිග භාෂාවන්හි සේ ම ඉංග්‍රීසි බසෙහි ද ප්‍රවීණ ප්‍රාචීන පඬිවරයෙක් අපට අහිමි විය.

**සේවාර්ජිත මහාචාර්ය විමල් බලගල්ලේ**
හිටපු පීඨාධිපති - ශාස්ත්‍රපීඨය

බෙල්ලන්විල විමලරතන අනුනාහිමිපාණන් වහන්සේ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ කථිකාචාර්යවරයෙකු හා මහාචාර්යවරයකු හා කුලපතීන් වහන්සේ ලෙස ද සේ ක්‍රියා කිරීම ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයට අභිමානයකි. පෙර අපර දෙදිග ඥානයෙන් පෘෂ්ටිමත් වූ විචක්ෂණ බුද්ධියෙන් අනූන කාලීන විද්වතකු වූ බෙල්ලන්විල නාහිමියෝ සාම්ප්‍රදායික දනුමට වඩා පියවර ගණනාවකින් ඉදිරියෙන් සිටි පඬි රුවනකි. උන් වහන්සේ කළ ශාස්ත්‍රීය සේවය එක ම ආචාර්ය මණ්ඩලයේ සේවය කළ අපට කිසි සේත් අමතක නොවේ.

**හිටපු උපකුලපති සේවාර්ජිත මහාචාර්ය චන්දිම විජේබණ්ඩාර**

පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

කිසිදු බලවේගයකට යටත් නොවී ජාතියේ ශාසනයේ යහපතට බාධා ඇති වන දෙයක් සිදු වන විට අභීත ව ඇඟිල්ල දිගු කිරීමට සිටි අන්තර්ජාතික ධර්මදූත මෙහෙවර ද ඉටු කරමින් ලෝක ශාසනික සේවයෙහි අවංක ව ආදර්ශවත් ව නිහතමානී ව දූරදර්ශී ව නියුතු වූ අපේ අතිගරු මහාචාර්ය බෙල්ලන්විල විමලරතන අනුනාහමියන්ගේ අපවත් වීමෙන් ලක් සසුනඹරට සිදු වූයේ පිරිමැසිය නොහැකි පාඩුවකි.

**ආචාර්ය කිරින්දේ අස්සජි ස්ථවිර**

පාලක සභා සාමාජික

අපවත් වී වදාළ බෙල්ලන්විල විමලරතන හිමිපාණන් ජාතික ආගමික හා ආධ්‍යාපනික ක්ෂේත්‍රවලට කරන ලද සේවය මිල කළ නො හැකි ය. ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ මහාචාර්යවරයකු වශයෙන් අනුපමේය සේවයක් ඉටු කොට පසු ව එම විශ්වවිද්‍යාලයේ ම කුලපති වශයෙන් තම කාර්යභාරය ඉටු කරමින් ලබා දුන් සේවාව විශ්වවිද්‍යාල ප්‍රජාවගේ සදාකාලික මතකයේ රැඳෙනු ඇති

**ටී. ධර්මරාජා**

පාලකසභා සාමාජික

මහා දැනුම් සම්භාරයක් නො සිතූ නො පැතූ මොහොතක රටට ජාතියට අහිමි වූ වග යි. අතිපූජනීය මහාචාර්ය බෙල්ලන්විල විමලරතන නාහිමියන්ට නිවන් සුව පතමි.

**සන්ධ්‍යා සල්ගාදු**

පාලකසභා සාමාජික

රටට ජාතියට ආගමට යම් තර්ජනයක් එල්ල වූ සෑම මොහොතක දී ම අප බෙල්ලන්විල විමලරතන අනුනාහිමියෝ පෙරමුණේ ම වූහ. පක්ෂ පාට ජාතිවාදය මෙන් ම ආගම්වාදය මිනිස් කසළ මෙන් පිටු දැක්ක අප අනුනාහිමියෝ සාධාරණත්වයත් සමානාත්මතාවත් යුක්තියත් තම අධ්‍යාත්මයේ රිද්මය බවට පත් කර ගත්හ. උන් වහන්සේගේ හඬ බලකාමී පවුරු පදනම් සැළුම් වෙවුළුම් කවන මහා කේසර සිංහරාජයකුගේ අභීත හිඬක් බවට පරිවර්තනය වී දෝංකාර දුන්නේ ය. ඒ හඬට පිටු පාන්නට කුමන වර්ණයකට අයත් මහ බලැති දේශපාලඥයන්ට වුව ද නොහැකි විය.

**සිරි රණසිංහ**

පාලක සභා සාමාජික

අපේ කුලපති නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ මානවශාස්ත්‍ර විෂය ක්ෂේත්‍රයෙහි පන්නරය ලබා ශාස්ත්‍රීය ලෝකය අතික්‍රමණය කළ විරල ගණයේ පඬිවරයෙකි. අපවත් වන තුරු ම ශාස්ත්‍රීය කටයුතුවල නිරත වූ අප සැමට ආදර්ශය සැපයූ පර්යේෂකයෙක්. අපේ පීඨයෙන් බිහි වූ උන්වහන්සේ කවදත් අප කෙරෙහි දැක්වූ කරුණාව සැමදා අපේ මතකයේ රැඳෙනු ඇත.

**මහාචාර්ය ඩී. පී. එස්. චන්ද්‍රකුමාර**
පීඨාධිපති - මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨය

බෙල්ලන්විල නායක හාමුදුරුවෝ පරිණත ජීවන අත්දැකීම්වලින් අපේ රටට මාර්ගෝපදේශ සැපයූ කෘතහස්ත ස්වාමීන් වහන්සේ නමකි. උන් වහන්සේ අපේ විශ්වවිද්‍යාලයේ ප්‍රගතිය වෙනුවෙන් අප මෙහෙයවා ලූ අපේ නායකයාණන් වහන්සේ යි.

**මහාචාර්ය සුදන්ත ලියනගේ**

පීඨාධිපති - ව්‍යවහාරික විද්‍යා පීඨය

පුරා වසර 33ක් වන හා පාරිසරික විද්‍යා අධ්‍යයනාංශයේ සේවයේ යෙදී සිටි මට නාහිමියන් සමග වඩා සමීප ව සම්බන්ධවීමට අවස්ථාව මට ලැබුණේ 2015 සිට පශ්චාත් උපාධි අධ්‍යයන පීඨයේ පීඨාධිපතිනිය ලෙස සේවය කරන්නට පටන්ගත් පසු ය. එහි දී මම නාහිමියන් සතු ව තිබූ වටිනා ගුණ රැසක් හඳුනා ගතිමි. ඉතා විශාල විෂයපථයක් තුළ දැනුවත් වූ උන්වහන්සේ ඍජු ප්‍රතිපත්ති සහිත තමන් නිවැරදි සේ දකින දේ පිළිබඳ ව කථා කරන දුර්ලභ ගණයේ පුද්ගලයෙකි. නිරහංකාර බව මිත්‍රශීලි බව උන් වහන්සේගේ ආභරණ විය. නියම බෞද්ධ භික්ෂුවක ලෙස රටටත් විශ්වවිද්‍යාලයටත් ජාත්‍යන්තරයටත් තම දැන්ම හා හැකියාව මඟින් මහඟු මෙහෙවරක් ඉටු කළ ඒ උත්තම චරිතය දෑයෙන් සමුගැනීම නිසා ඇති වූ හිස් තැන පියවීම ඉතා අසීරු කරුණකි. උන් වහන්සේ අද අප අතර නැති වුවත් උන්වහන්සේගේ ගුණ සමුදාය පිළිබඳ ආදරණීය මතකය කිසිදා නො මියෙනු ඇත.

**ජ්‍යෙෂ්ඨ මහාචාර්ය හේමන්ති රණසිංහ**
පීඨාධිපති - පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය

අපේ කුලපති ස්වාමීන් වහන්සේ අපේ විශ්වවිද්‍යාලයට කීර්තිය ගෙන දුන් ලෝ පතළ භික්ෂූන් වහන්සේ නමක් බව කිව යුතු යි. උන් වහන්සේගේ ඍජු බව මම අතිශයින් අගය කරමි.

**ආචාර්ය යූ. අනුර කුමාර**
පීඨාධිපති - කළමනාකරණ අධ්‍යයන හා වාණිජවිද්‍යා පීඨය

අපේ කුලපති හිමියෝ විශ්වවිද්‍යාලයට ජීවය දුන් ජාතියට පණ පෙවූ සසුනඹරේ වැජඹුණු ස්වාමීන් වහන්සේ නමකි.

**මහාචාර්ය සුරංගි යසවර්ධන**
පීඨාධිපති - වෛද්‍ය විද්‍යා පීඨය

ශ්‍රී ලංකාවේ පාරම්පරික උරුමය පිළිබඳ මනා දැනුමකින් හෙබි බෙල්ලන්විල නායක හාමුදුරුවො සැබෑ සංඝ පිතෘවරයෙකි.

**මහාචාර්ය පී. බී. මණ්ඩාවල**
පීඨාධිපති - තාක්ෂණ විද්‍යා පීඨය

අපට කරුණාවෙන් කථා කළ කුලපති නාහිමියන් අපේ රටේ සැම දෙනාගේ ගෞරවය දිනා ගත් ඍජු ගුණ ඇති ස්වාමීන් වහන්සේ නමක්.

**ආචාර්ය අකිල සුභසිංහ**
පීඨාධිපති - ඉංජිනේරු විද්‍යා පීඨය

අපේ විමලරතන හාමුදුරුවෝ බෙල්ලන්විල මහ පන්සල ඇතුළු පන්සල් ගණනාවක් පාලනය කරති. පෙරහැරවල් පවත්වති. බණට දානයට වඩිති. දායක කාරකාදීන්ගේ සුව දුක් සොයා බලති. දරුවන්ට අකුරු කියවති. විශ්වවිද්‍යාලයේ කුලපතිකම් කරති. ජාත්‍යන්තර සාමයික සම්මන්ත්‍රණවලට සහභාගී වීම සඳහා දේශ දේශාන්තරවල සැරිසරති. කෝට්ටේ ශ්‍රී කල්‍යාණි සාමග්‍රීධර්ම මහාසංඝසභාවේ අනුනායක ධුරය හොබවති. මේ සා වැඩ කන්දරාවක් කරන හිමි නමකට පොතක් පතක් ලියන්නට තබා පත්තරයක් කියවන්නට විවේකයක් තිබේ ද? එහෙත් උන් වහන්සේ

විශ්වවිද්‍යාලයේ කථිකාචාර්යකම් කළ අවධියේ ආරම්භ කළ ශාස්ත්‍රීය සේවාව අඛණ්ඩ ව පවත්වාගෙන එති. ගවේෂණයේ ද පර්යේෂණයේ ද ලේඛනයේ ද යෙදෙති.

**සේවාර්ජිත මහාචාර්ය සුනිල් ආරියරත්න**
සිංහල හා ජනසන්නිවේදන අධ්‍යයනාංශය

විද්‍යොදය විශ්වවිද්‍යාලයේ ඉගෙනගත් කාලයේ පටන් මා හඳුනන බෙල්ලන්විල නායක හාමුදුරුවෝ මේ යුගයේ වැඩසිටි යුග පුරුෂයෙකි. අපක්ෂපාතී ව මධ්‍යස්ථ මතධාරී ව රටට නායකත්වය ලබා දුන් පැවිදි පඬි රුවනකි. ඍජු බව ආදි ගුණවලින් පිරිපුන් පූජනීය භික්ෂූන් වහන්සේ නමකි. ලාභාපේක්ෂාවලින් වියුක්ත ව කථා කළ අභීත මහතෙරනමකි. පටිසන්ථාර ගුණයෙන් අපට සංග්‍රහ කළ ගුණවතෙකි. සිංහල හා ඉංග්‍රීසි භාෂාද්වයෙන් ශාස්ත්‍රීය කටයුතුවල නියැලි විද්වත් හිමිනමකි. සංඝයාගේ සාමග්‍රිය උදෙසා කැප වූ කල්‍යාණ මිත්‍රයෙකි.

**මහාචාර්ය රත්න විජේතුංග**
විශ්‍රාමික මහාචාර්ය - සිංහල හා ජනසන්නිවේදන අධ්‍යයනාංශය

ආදර්ශවත් බුද්ධපුත්‍රයකු වන අපේ කුලපති නාහිමිපාණන් වහන්සේ බුදුරජාණන් වහන්සේ පෙන්වා වදාළ මග අනුව ලොවට සේවය කළ හාමුදුරුනමක්. විශ්වවිද්‍යාල ජීවිතයේ දී උන්වහන්සේ ඇසුරු කිරීමෙන් මා ලද අත්දැකීම් අනුව බෙල්ලන්විල නාහිමියන් මධ්‍යස්ථව කටයුතු කළ සැමගේ සමගිය අපේක්ෂා කළ ස්වාමීන් වහන්සේ නමක් බව කිව යුතුයි.

**මහාචාර්ය මාලනී ඇඳගම**
විශ්‍රාමික මහාචාර්ය - ඉතිහාස හා පුරාවිද්‍යා අධ්‍යයනාංශය

අපේ කුලපති නාහිමිපාණන් වහන්සේ සුපේශල ශික්ෂාකාමී, විනයගරුක, උජුපටිපන්න, සංඝශෝභන ගුණයන්ගෙන් පිරිපුන් යතිවරයාණ කෙනෙකි. විශ්වවිද්‍යාලයේ දක්ෂ ආචාර්යවරයෙකි. දේශ හිතෛෂී ය. ජාතිමාමක ය. කලාකාමී ය. පරිත්‍යාගශීලී ය. පාලි සංස්කෘත සිංහල හා ඉංග්‍රීසි භාෂාවන්හි මනා පටුත්වයක්

ඇති ලොව පිළිගත් විද්වතෙකි. පිරිස පාලනයෙහි මෙන් ම කටයුතු සංවිධානයේ ද සමතෙකි. සමස්ත මානව සමාජයට පමණක් නොව සතා සිවුපාවාට ද ආදරය කරුණාව දයාව මෛත්‍රිය පැතිරවූ උතුමෙකි. එමෙන් ම කල්‍යාණ මිත්‍රයෙකි. උන්වහන්සේගේ හදිසි අපවත්වීම රටට ජාතියට ආගමට සමාජයට පිරිමැසිය නොහැකි පාඩුවකි.

**මහාචාර්ය කිවුලේගෙදර නාරද ස්ථවිර**
සිංහල හා ජනසන්නිවේදන අධ්‍යයනාංශය

අප නාහිමියන් හා අපගේ ඇසුර දශක ගණනාවක් පසුපසට දිවෙයි. එය ගිහිපැවිදි මෙන්ම ගුරු සිසු ඇසුරකි. 1982 දී අමරදේව ප්‍රතිසංවේදයේ දී උන්වහන්සේ අපට උපදෙස් දුන්හ. බෞද්ධ දර්ශනය, පාලි, සංස්කෘත මෙන් ම ඉංග්‍රීසි භාෂා දැනුමෙන් ද පෝෂණය වී අප නාහිමියෝ සෞන්දර්යවේදය සම්බන්ධ බෞද්ධ පර්යාලෝකයෙන් පොත්පත් බිහි කළහ. බෞද්ධ නීති දර්ශනය පිළිබඳ අප නාහිමියන් විසින් රචනා කළ ලේඛන අපි මූලාශ්‍රය ගොන්නට එකතු කළෙමු. අපරාධවිද්‍යා හා අපරාධ යුක්ති පරිපාලනය පශ්චාද් උපාධි ඩිප්ලෝමාවටත් උක්ත උපාධියටත් ඒවා භාවිත කළෙමු. ඒ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ සමාජවිද්‍යා හා මානවවිද්‍යා අධ්‍යයනාංශය ඇසුරේ ය.

සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනය පැවැත් වූ බෞද්ධ සාහිත්‍ය උත්සවයේ දී පිළිවෙළින් 2011 හා 2015 වර්ෂවල උන්වහන්සේ විසින් රචනා කරන ලද **බුදුපිළිමයට පෙර බුදු හාමුදුරුවෝ** හා **බෞද්ධ පුද පූජා සංස්කෘතිය** උභය කෘතීන් සම්මානයට පාත්‍ර විය.

සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනයේ දී මසකට වරක් හෝ කීපවරක් රැස් වන බුද්ධශාසන කාර්යසාධක සමිතියේ රැස්වීම්වලට උද්‍යෝගයෙන් සහභාගි වූ උන් වහන්සේ රට දැය සමය ජන සමාජය සංස්කෘතිය වෙනුවෙන් එහි අභ්‍යුදය පතා සුවිශාල කාර්යභාරයක් ඉටු කළහ. බෞද්ධ පුනර්ජීවන වැඩසටහනේ දී මූලිකත්වය ගෙන ක්‍රියා කළ අප මාහිමියෝ

මානවකේන්ද්‍රණවාදී අදහස් ආකල්ප බැහැර කොට බුදුදහම අනුව මධ්‍යස්ථ ප්‍රතිපදාවක ක්‍රියාකිරීම අප කාටත් ආදර්ශයකි.

**ආචාර්ය ප්‍රණීත් අභයසුන්දර**
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය - සමාජවිද්‍යා හා මානවවිද්‍යා අධ්‍යයනාංශය
හිටපු සභාපති - සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනය

1960 අග භාගයේ දී විද්‍යොදය විශ්වවිද්‍යාලයේ ශිෂ්‍යයකු ලෙස ඇතුළත් වූ බෙල්ලන්විල පොඩි හාමුදුරුවන්ට ඉගැන්වීමේ කටයුතු කිරීමට මම බෙහෙවින් භාග්‍ය සම්පන්න වීමි. උන් වහන්සේට ඉගැන්වීමේ කටයුතු කළ ආචාර්යවරුන් අතුරින් අද ජීවතුන් අතර සිටින්නේ මාත් මහාචාර්ය ආනන්ද ගුණසිංහ මහතාත් පමණි. එදා සිට අද දක්වා ම ආචාර්යවරුන්ට මහත් ලෙන්ගතු බවකින් හා ආදරයකින් කටයුතු කිරීමේ ගුණාංගය බෙල්ලන්විල ස්වාමීන්ද්‍රයන් වහන්සේ සතුව පැවති සුවිශේෂී ලක්ෂණයකි. එදා ඇරඹි ගුරුගෝල සම්බන්ධතාව මත ගොඩනැගුණු මිත්‍රශීලි බව ලෙන්ගතු බව උන් වහන්සේ කෙතරම් කීර්තියට හා ප්‍රසිද්ධියට පත් වුවද අඩු වූයේ නැත. උන් වහන්සේ සතු ව පැවති දැනුම හා සහජ කුශලතාව දැක එය ඔප් නැංවීම සඳහා අපි නිරතුරු ව දිරිමත් කෙළෙමු. එයින් වෙසෙස් ප්‍රයෝජන ලබාගත් උන්වහන්සේ ජාතික ව හා ජාත්‍යන්තර ව ථේරවාද බුදුදහමේ සහ සංඝ ශාසනයේ අභිවර්ධනය උදෙසා කටයුතු කළහ. වර්තමාන භික්ෂූන් වහන්සේලා අතර නිර්භීත ව සහ ඍජු ව තම මතය ප්‍රකාශ කළ යතිවරයෙකු වූ උන් වහන්සේ දේශපාලන පක්ෂ භේද නොසලකමින් රාජ්‍ය නායකයන් රටේ යහපත උදෙසා යෙදවීමට එඩිතරව ප්‍රකාශ නිකුත් කළහ. ආගමික, සාමාජික හා දේශපාලනික වශයෙන් වෙසෙස් මෙහෙවරක් ඉටු කළ බෙල්ලන්විල අපේ කුලපති නාහිමියන්ට මුළු රට ම ණය ගැති ය.

**මහාචාර්ය ආරියපාල පෙරේරා**
විශ්‍රාමික මහාචාර්ය - පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය

විශ්‍රාම ලබන තෙක් ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ පරිපාලන කටයුතුවල දී විවිධ මට්ටමින් දායක වී ඇති මාහට අපේ මහාචාර්ය බෙල්ලන්විල විමලරතන කුලපති හිමිපාණන් වහන්සේ ගැන ඇත්තේ අපරිමිත ගෞරවාදරයකි. ප්‍රසාදයකි. විශ්වවිද්‍යාල ආචාර්යවරයකු ලෙස පීඨමණ්ඩලය තුළ කටයුතු කිරීමේ දී උන් වහන්සේ ක්‍රියා කළ අකාරය සැබැවින් ම වර්තමාන විශ්වවිද්‍යාල ප්‍රජාවට මහත් ආදර්ශයකි. පීඨ සභාව තුළ පළමු ව කිසියම් කරුණක් සම්බන්ධයෙන් පැන නගින තර්ක විතර්කවලට සවන් දී සිටින උන් වහන්සේ ඒ පිළිබඳ ව මනාඅවබෝධයක් ලබා ගනිති. දෙවනු ව කිසිවකුට බිඳ හෙළිය නොහැකි සහේතුක කරුණු දැක්වීමකින් ප්‍රස්තුත කරුණෙහි ඇති යථා ස්වභාවය පෙන්වා දෙති. තෙවනු වැද්ගත වී ඇති ව්‍යාකුලත්වය අදානග්‍රාහී නො වී විමර්ශනය කර සාර්ථක විසඳුම් යෝජනා කරති. විශ්වවිද්‍යාල අධ්‍යාපනයටත් ජාතිකසමගියටත් ආගමිකසංහිඳියාවටත් විශාල සේවාවක් සිදු කළ අපේ මහාචාර්ය බෙල්ලන්විල විමලරතන කුලපති ස්වාමීන්ද්‍රයන් වහන්සේ සතු වූ වටිනා ම ගුණය ලෙස මා දකින්නේ ඕනෑ ම අභියෝගාත්මක අවස්ථාවක දී තම මතය නිර්භය ලෙස නොපැකිළ ව ඉදිරිපත් කිරීමේ අදීන පිළිවෙත යි.

**සේවාර්ජිත මහාචාර්ය එම්. එම්. කරුණානායක**

භූගෝලවිද්‍යා අධ්‍යයනාංශය

විද්‍යෝදයවිශ්වවිද්‍යාලයේ ප්‍රථම කථිකාචාර්යවරිය ලෙස සේවයට බැඳී පුරාවසර 40කට ආසන්න කාලයක් එහි සේවය කළ මාහට මහාචාර්ය බෙල්ලන්විල විමලරතන අපේ කුලපති හිමිපාණන් වහන්සේ ගැන ඇත්තේ අනුස්මරණීය මතකයකි. මා පශ්චාද් උපාධි අධ්‍යයන මණ්ඩල සභාපතිනිය ලෙස කටයුතු කරන කාලයෙහි කිසියම් ගැටළුවක් විසඳා ගනු වස් උන් වහන්සේගේ උපදෙස් පැතුවෙමි. එහි දී උන් වහන්සේ අදාළ කරුණ සම්බන්ධයෙන් සාවධාන වූ ආකාරයත් එම ගැටළුව නිවැරදි ව අවබෝධ කර ගනිමින් යෝග්‍ය හා නිරවද්‍ය විසඳුමක් ලබාදුන් ආකාරයත් මා උගත් ඉතා අපූර්ව පාඩමකි. අවශ්‍ය මොහොතේ දී නිසි බුද්ධිමත් තීරණ ගැනීමෙහි ලා අපේ බෙල්ලන්විල

අනුනාහිමිපාණන් වහන්සේ සතු වූ කෘතහස්ත බව සදා අප හදවත් තුළ රැඳෙනු ඇත.

**ස්වාර්ජිත මහාචාර්ය ධම්මිකා වනසිංහ**

භූගෝලවිද්‍යා අධ්‍යයනාංශය

විශ්වවිද්‍යාල ආචාර්යවරයකු වශයෙන් මා පළමු වරට අපේ කුලපති හාමුදුරුවන් මුණ ගැසුණු විට මඳ සිනහවක් පා "සංඝසෝභන" යැයි අලුත් නමකින් ඇමතූ අයුරු තවමත් සිහියට නැගෙයි. මාගේ නිවැරදි නම දැනගත් පසුත් හමු වන හැම අවස්ථාවක දී ම සිතාමතා ම පෙර කී නම කියා සිනහ පෑමෙන් උන් වහන්සේ අපගෙන් අපේක්ෂා කළේ කුමක් ද යන්න තව දුරටත් රහසක් නො වේ. ශ්‍රී ලාංකේය භික්ෂූන් වහන්සේ විවිධ විෂය ක්ෂේත්‍රයන්හි ප්‍රාමාණික වියතුන් වී ශාසනික ප්‍රතිපදාවන් සුරකිමින් පෙරට ම ගමන් කරන පරමාදර්ශී චරිත වනු දැකීම උන් වහන්සේගේ හෘදයාංගම අපේක්ෂාව විය. උපාධි ප්‍රදානෝත්සවයට පමණක් සීමා නොවූ කුලපතිවරයකු වූ බෙල්ලන්විල නාහිමිපාණන් වහන්සේ පිළිබඳ මතකය සදානුස්මරණීය වන්නට උන් වහන්සේ අපට දායාද කළ දේ බොහෝ ය. විශ්වවිද්‍යාලය අර්බුදයක සිර වන සෑම මොහොතක දී ම ආරාධිත ව හෝ අනාරාධිත ව ඒවාට මැදිහත් වී සාර්ථක විසඳුම් ලබා දෙන්නට උන් වහන්සේ පසුබට නො වූහ. විදේශීය බෞද්ධ නායකයන්ගේ නොමඳ ගෞරවාදරය ලබමින් ලෝක බෞද්ධ සංඝ සම්මේලනයේ අන්තර්ජාතික ලේඛකාධිකාරී ධුරය හෙබවූ උන් වහන්සේ රටේ කීර්ති නාමය ඔසවා තබන්නට සිදු කළ මෙහෙය අනභිභවනීය යි. හදිසියේ වත් 'උන් වහන්සේ අපෙන් සමු ගත්තේ රටටත් ජාතියටත් සම්බුදු සසුනටත් උන් වහන්සේගේ සේවය අත්‍යවශ්‍ය මොහොතක ය" මේ අපේ කුලපති හාමුදුරුවෝ" යැයි අභිමානයෙන් මුව පුරා කිව හැකි එබඳු නිර්පාක්ෂික, අදීන උජු පටිපන්න සංඝරාජයාණන් වහන්සේ නමක් අප යළිත් කෙසේ නම් ලබන්න ද?

**ආචාර්ය පින්නවල සංඝසුමන හිමි**

ලෝක බෞද්ධ සංඝ සභාවේ විධායක සභික සහ

භූගෝල විද්‍යා අධ්‍යයනාංශයේ ජ්‍යෝෂ්ඨ කථිකාචාර්ය

මහාචාර්ය බෙල්ලන්විල විමලරතන නායක ස්වාමීන් වහන්සේ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ කුලපති ස්වාමීන් වහන්සේ බලාපොරොත්තු නොවූ අවස්ථාවක අපවත් වී වදාළ බව දැන ගැනීමෙන් මම බලවත් ශෝකයට පත්වීමි. උන් වහන්සේ මම දීර්ඝකාලයක් ඇසුරු කර ඇත්තෙමි. නොයෙක් ආගමික, සාමාජික හා සංස්කෘතික වැඩ කටයුතුවල දී මිත්‍රත්වයෙන් හා සහයෝගයෙන් ද මධ්‍යස්ථ ව හා බුද්ධිමත් ව ද කටයුතු කිරීමේ ප්‍රවණතාවක් උන් වහන්සේ සැම විට ම විදහා පෑ සේක. ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය හා සම්බන්ධ කටයුතුවල දී ද අධ්‍යාපන ක්ෂේත්‍රයේ ප්‍රශ්නවල දී ද උන් වහන්සේ සමග කටයුතු කිරීමට ලැබීම මහත් ගෞරවයක් හා වාසනාවක් ලෙස මම සලකමි. උන් වහන්සේ සැම විට පෙන්වූ සාමූහික දැක්ම, ආගමික වටිනාකම්, සමයාන්තර සුහදතාව, දේශය දෙසට ඇල්ම, විශ්වීය දෙයට විවෘත බව ආදි මහඟු ගුණාංගයන් අපි දු අප ජීවිත තුළ ජීවත් කරවන්නට වෙර දරමු. එය උන් වහන්සේට කරන උපහාරයක් වනු ඇත. උන් වහන්සේට තමන් වහන්සේ පැතූ නිවන් සුව නොමඳ ව ලැබේවා.

**අයිවන් පෙරේරා පියතුමා**

පාලකසභා සාමාජික

මහාචාර්ය බෙල්ලන්විල විමලරතන ස්වාමීන් වහන්සේ ආචාර්යවරයකු වශයෙන් වසර 25කට අධික කාලයක් අප විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍රපීඨයෙහි උන්නතිය උදෙසා ශාස්ත්‍රීය වශයෙන් සුවිශාල කාර්යභාරයක් ඉටු කළහ. කුලපති ස්වාමීන් වහන්සේ ලෙස උන් වහන්සේ විසින් විශ්වවිද්‍යාලයේ දියුණුව උදෙසා කළ මඟ පෙන්වීම මෙන් ම ජාතික හා ආගමික සංහිඳියාව ඇති කිරීම විෂයෙහි දැක්වූ උද්‍යෝගය මම බෙහෙවින් අගය කරමි.

**මහාචාර්ය චාමලී නාහල්ලගේ**

මානවවිද්‍යා අධ්‍යයනාංශය

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයයේ කුලපති ධුරීණ
අතිපූජ්‍ය මහාචාර්ය බෙල්ලන්විල විමලරතනාභිධාන
කෝට්ටේ ශ්‍රී කල්‍යාණී සාමග්‍රීධර්ම මහාසංඝසභාවේ
අනුනායක හිමිපාණන්ගේ ආදාහනෝත්සවය නිමිත්තෙන්
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයය විසින් ප්‍රකාශිත යි.

මුද්‍රණ අනුග්‍රහය:
සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව
8 වන මහල,
සෙත්සිරිපාය,
බත්තරමුල්ල.

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයයේ කුලපති ධුරීණ
අතිපූජ්‍ය මහාචාර්ය බෙල්ලන්විල විමලරතනාභිධාන
කෝට්ටේ ශ්‍රී කල්‍යාණී සාමග්‍රීධර්ම මහාසංඝසභාවේ අනුනායක
හිමිපාණන්ගේ ආදාහනෝත්සවය නිමිත්තෙන්
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයය විසින් ප්‍රකාශිත යි.
2018 පෙබරවාරි 08